# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 49 — 1973 මාර්තු 02 වැනි සිකුරාදා — 1973.03.02

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන් වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... ... | 269 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| කනතුරු—ඇබෑර්තු ... ... ... | — | අය-වැය ලේඛන ... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 270 | දේපල විකිණීම ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | 271 | මාර්ග කොමිටි දැන්වීම් ... ... ... | — |
| පළාත් පාලන සභා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් ... | — | විවිධ දැන්වීම් ... ... ... ... | 274 |


සැළකිය යුතුයි.—මැණික් (කමං කිරීමේ) පනත් කෙටුම්පත 1973 පෙබරවාරි 15 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

## පළාත් පාලන නිවේදන

දෙහිඕවිට සුළු නගර සභාව

ප්‍රසිද්ධ රඟ දැක්වීම් ආඥාපනත

(176 වන අධිකාරය වන) ප්‍රසිද්ධ රඟ දැක්වීම් ආඥාපනතේ 3 වැනි වගන්තියෙන් රාජ්‍ය පරිපාලන පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඔහු විසින් පනවනු ලැබූ රීතිය.

ෆීලික්ස්. ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති.

1973 පෙබරවාරි මස 12 වැනි දින,
කොළඹ දී ය.

රීතිය

(176 වන අධිකාරය වන) ප්‍රසිද්ධ රඟ දැක්වීම් ආඥාපනත යටතේ පනවා 1919 අප්‍රේල් මස 4 වැනි දින අංක 7,004 දරණ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබ, 1967 ජූලි මස 13 වැනි දින අංක 14,757 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ රීතියෙන් අන්තිම වරට සංශෝධිත රීති, එකී රීතිවල අ. 3 වැනි රීතිය වෙනුවට පහත දැක්වෙන අළුත් රීතිය ආදේශ කිරීමෙන්, ඒ රීතිය දෙහිඕවිට සුළු නගර සභාවේ පරිපාලන සීමාවලට ඇතුළු වන ප්‍රදේශයට අදාල වන තාක් දුරට මෙයින් තව දුරටත් සංශෝධනය කරනු ලැබේ.

"අ 3(1) මුදල් අයකර පුද්ගලයන් ඇතුලු කරගනු ලබන යම් ප්‍රසිද්ධ රඟ දැක්වීමක් පැවැත්වීම සඳහා ගොඩනැගිල්ලක් පාවිච්චි කිරීම පිණිස බලපත්‍රයක් ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු, බලපත්‍රය තමා වෙත නිකුත් කරනු ලැබීමට පෙර පහත සඳහන් ප්‍රමාණයන් අනුව ගණන් බලනු ලබන ගාස්තුවක් සභාවට ගෙවිය යුතුය.

සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම් සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ

## විශේෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දැක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාදවී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1973 ජනවාරි මස 7 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.


269—70818—5,618 (73/2)

F 1

| | එක් දිනකට රු. ශ. | | | එක් මාසයකට රු. ශ. | | | එක් අවුරුද්දකට (දෙසැ. 31 න් අවසන් වේ) රු. ශ. | |
|---|---|---|---|---|---|---|---|---|
| ආසන පහසුකම් සැපයෙන තැනැත්තන්ගේ ගණන 199 කට වැඩි නොවන කල්හි ... ... | 3 | 0 | ... | 30 | 0 | ... | 150 | 0 |
| ආසන පහසුකම් සැපයෙන තැනැත්තන්ගේ ගණන 199 වැඩි නමුත් 499 ට වැඩි නොවන කල්හි ... | 5. | 0 | ... | 60 | 0 | ... | 200 | 0 |
| ආසන පහසුකම් සැපයෙන තැනැත්තන්ගේ ගණන 499 ට වැඩි වන කල්හි ... ... | 10 | 0 | ... | 100 | 0 | ... | 300 | 0" |

3-11—73.03 02 දින අංක 49 දරණ ගැසට් පත්‍රය

---

### ගම්සභා ආඥාපනත

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 5 සහ 10 වැනි වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය ෆීලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම, මෙම ආඥාවෙන් මොණරාගල දිස්ත්‍රික්කයේ සියඹලාණ්ඩුව ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ සියඹලාණ්ඩුව සහ දොඹගහවෙල නව ගම් ප්‍රදේශ සංස්ථාපනය කිරීමට අදාලව 1972 ඔක්තෝබර් මස 9 වැනි දින අංක 28/4 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද ආඥාව පරිච්චින්න කරමි.

ෆී. ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය.

1973 පෙබරවාරි මස 13 වෙනි දින,
කොළඹදී ය.

3–16—73.03.02 දින අංක 49 දරණ ගැසට් පත්‍රය

---

### හලාවත නගරය

නගර සභා ආඥාපනත

**1973 වර්ෂය සඳහා වූ දේපල බද්ද**

(255 වැනි අධිකාරය වන) නගර සභා ආඥාපනතේ 160 වැනි වගන්තිය යටතේ සහ ඒ වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් දෙන ලද අනුමැතිය ඇතිව විශේෂ කොමසාරිස් විසින් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම්වලට, සුදුසුකම්වලට හා කොන්දේසිවලට යටත්ව හලාවත නගරය තුළ පිහිටා තිබෙන සියළුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට පහළොව බැගින් වූ දේපොල බද්දක් පිළිවෙලින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනයන්හි දී සමාන කොටස් හතරකින් ගෙවිය හැකි පරිදි 1973 වර්ෂය සඳහා හලාවත නගරයේ විශේෂ කොමසාරිස් විසින් පනවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 ජනවාරි මස 31 දින,
කොළඹදී ය.

3–10—73.03.02 දින අංක 49 දරණ ගැසට් පත්‍රය

---

### විශේෂ කොමසාරිස් කාර්යාලය, කහවත්ත නගරය

සුළු නගර සභා ආඥාපනත

**1973 වර්ෂය සඳහා වූ විශේෂ කසළ ශෝධන බද්ද**

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 129 (අ) වැනි වගන්තිය යටතේ කහවත්ත නගරයේ විශේෂ කොමසාරිස් විසින් අතුරු ව්‍යවස්ථා මගින් නියම කරනු ලැබිය හැකි සීමාකිරීම් හා නිදහස් කිරීම් වලට යටත් ව කහවත්ත නගරය තුළ පිහිටා ඇති සියළුම නිශ්චල දේපල වල වාර්ෂික වටිනාකමින් සියයට හතර බැගින් වූ විශේෂ කසළ ශෝධන බද්දක් පිළිවෙලින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනයන්හි දී සමාන කොටස් හතරකින් ගෙවිය හැකි වන සේ තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන කොමසාරිස් විසින් දෙන ලද අනුමතිය අතිව 1973 වර්ෂය සඳහා පනවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්ලිව්. ඊ. වී. එස්. ද අල්විස්,
පළාත් පාලන කොමසාරිස්.

1973 පෙබරවාරි මස 6 වැනි දින,
කොළඹ දී ය.

3–69—73.03.02 දින අංක 49 දරණ ගැසට් පත්‍රය

---

## විභාග, විභාග ප්‍රතිඵල ආදිය

### පළාත් පාලන සේවයේ කර්මාන්ත/ජලකර්මාන්ත අධිකාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

පහත නම් සඳහන් නිලධාරියා ඉහත සඳහන් කර ඇති කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කර ඇති බැව් මෙයින් දන්වමි.

ඩබ්. ඩී. සුමනසිරි මහතා—කොළඹ නගර සභාව.

එඩ්ගා ප්‍රනාන්දු,
ලේකම්,
පළාත් පාලන සේවා කොමිෂන් සභාව.

1973 ජනවාරි මස 24 දින,
තැ. පෙ. 530,
කොළඹ.

3-19—73.03.02 දින අංක 49 දරණ ගැසට් පත්‍රය

---

### පළාත් පාලන සේවය

මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය 1972

පහත නම් සඳහන් නිලධාරියා කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කර ඇත.

1. යූ. පී. රොබින්සන්.

පහත නම් සඳහන් දෙදෙනා ඔවුන්ගේ නම් ඉදිරියෙහි දක්වා ඇති විෂයයන්ගෙන් පමණක් සමත් ය.

1. ජී. ඒ. නානායක්කාර—වාචක හා ප්‍රායෝගික.
2. එච්. ඩබ්. පියසේන—වාචක හා ප්‍රායෝගික.

එඩ්ගා ප්‍රනාන්දු,
ලේකම්,
පළාත් පාලන සේවා කොමිෂන් සභාව.

1973 ජනවාරි මස 24 දින,
තැ. පෙ. 530,
කොළඹ.

3–20—73.03.02 දින අංක 49 දරණ ගැසට් පත්‍රය

# අතුරු ව්‍යවස්ථා

## බදුල්ල මහ නගර සභාව

### මහ නගර සභා ආඥාපනත

(252 වන අධිකාරය වන) මහ නගර සභා ආඥාපනතේ 267 වන හා 272 වන වගන්ති යටතේ බදුල්ල මහ නගර සභාව විසින් සාදනු ලැබ, ඒ ආඥාපනතේ 268 වන වගන්තිය යටතේ රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍ය වරයා විසින් අනුමත කරන ලදුව, ජාතික රාජ්‍ය සභාව විසින් ස්ථිර කරන ලද අතුරු ව්‍යවස්ථාව.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා සවදේශ
කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

1973 පෙබරවාරි මස 19 වැනි දින,
කොළඹ දී ය.

**ඝෝෂාවට අදාළ අතුරු ව්‍යවස්ථාව**

(252 වන අධිකාරය වන) මහ නගර සභා ආඥාපනතේ 267 වන සහ 272 වන වගන්ති යටතේ බදුල්ල මහ නගර සභාව විසින් සාදනු ලැබ, 1970 මාර්තු මස 5 වන දින අංක 14,896 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද, අතුරු ව්‍යවස්ථාවල අංක 1 දරන අතුරු ව්‍යවස්ථාවේ "පෝ දිනකම" යන පාඨය වෙනුවට "ඉරිදා දිනකම" යන පාඨය ආදේශ කිරීමෙන් ඒ අතුරු ව්‍යවස්ථා මෙයින් සංශෝධනය කරනු ලැබේ.

3–172—73.03.02 දින අංක 49 දරණ ගැසට් පත්‍රය

---

ඇල්. ඞී. බී 180/32.

## ගාල්ල මහ නගර සභාව

### මහ නගර සභා ආඥාපනත

(252 වැනි අධිකාරය වන) මහ නගර සභා ආඥාපනතේ 267 සහ 272 වැනි වගන්ති යටතේ ගාල්ල මහ නගර සභාව විසින් සම්පාදිතව එකී ආඥාපනතේ 268 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් අනුමත කරන ලදුව, ජාතික රාජ්‍ය සභාව විසින් සථිර කරන ලද අතුරු ව්‍යවස්ථා.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා සවදේශ
කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

1973.2.12 වැනි දින,
කොළඹදීය.

**මහජන පුස්තකාලයට අදාළ අතුරු ව්‍යවස්ථා**

ගාල්ල මහ නගර සභාව විසින් පිහිටුවා නඩත්තු කරනු ලබන මහජන පුස්තකාලය—

(අ) පොත්පත් බැහැරට දෙන පුස්තකාලයක්,

(ආ) ආශ්‍රය පුස්තකාලයක්,

(ඇ) කියවීම් ශාලාවක් සහ

(ඈ) ළමයින්ගේ පුස්තකාලයක්

යන අංශවලින් සමන්විත යුතුය.

මහජන පුස්තකාලයේ සාමාන්‍ය පරිපාලනය—

(අ) එවකට ගාල්ල මහ නගර සභවේ නගරාධිපති තැන,

(ආ) නිල බලයෙන් ලේකම් වශයෙන් ක්‍රියා කළ යුතුවූ සභාවේ ලේකම් තැන,

(ඇ) සභාව විසින් තෝරා පත් කරගත හැකි ගාලු මහ නගර සභාවේ සභිකයින් සිව් දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවක්

(ඈ) ගාලු මහ නගර සභාව විසින් තෝරා පත් කර ගනු ලබන නාගරික සීමාව තුළ පදිංචි ප්‍රභූවරුන් හත් දෙනෙක් යන අයගෙන් සමන්විත පුස්තකාල කමිටුවක් (මින් ඉදිරියට 'කමිටුව' වශයෙන් හඳුන්වනු ලබන)

වෙත පැවරිය යුතුය.

(2) මහජන පුස්තකාලය භාරව ක්‍රියා කරන පුස්තකාලයාධිපති තැන පුස්තකාලයේ පිලිවෙත පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් වගකිව යුතුය.

3. (1) ගාල්ල මහ නගර සභාවේ නගරාධිපතිවරයා නිලබලයෙන් කමිටුවේ සභාපති වරයා වන අතර කමිටුවේ සෑම රැස්වීමකම මූලාසනය ඔහු විසින් දැරිය යුතුය. නගරාධිපතිවරයා පැමිණ නොමැති රැස්වීමක දී කමිටුවේ සාමාජිකයින් විසින් ඒ කාර්යය සඳහා තෝරා ගනු ලබන කමිටුවේ සාමාජිකයෙකු රැස්වීමේ මූලාසනය දැරිය යුතුය.

(2) යම් රැස්වීමක මූලාසනය දරන සභිකවරයාට මුල් ඡන්දය සමඟ කිසියම් ප්‍රශ්නයකදී සම ඡන්ද සංඛ්‍යාවක් තිබේ නම් තීරක ඡන්දයක් ද තිබිය යුතුය.

4. සභිකයින් තිදේනෙකුගෙන් යුත් ගණ පූරණයක් නොමැති නම් කමිටුවේ යම් රැස්වීමකදී කවර කාර්යයක් හෝ නොකළ යුතුය.

5. අවශ්‍යයයි සැලකිය හැකි යම් කොන්දේසිවලට යටත්ව මහජන පුස්තකාලයට අයිති කවර කොටසක් හෝ පාවිච්චි කිරීමට කිසියම් තැනැත්තෙකුට බලය දීමටත්, පුස්තකාලයට අදාල මෙම අතුරු ව්‍යවස්ථා වලින් කිසිවක් උල්ලංඝනය කළ තැනැත්තෙකුට පුස්තකාලයේ කවර කොටසක් හෝ පාවිච්චි කිරීමට ඉඩ නොදීමටත් කමිටුවට බලය තිබේ.

**පොත්පත් බැහැරට දෙන පුස්තකාලය :**

6. (1) පහත සඳහන් අවශ්‍යතාවයන් සපුරා තිබුණහොත් මිස කිසිම තැනැත්තෙකු පොත්පත් බැහැරට දෙන පුස්තකාලයේ සාමාජිකයෙකු වශයෙන් ඇතුළත් කර නොගත යුතුය.

(අ) වයස අවුරුදු 12 ට අඩු නොවිය යුතුය.

(ආ) ලිවීමේ හා කියවීමේ හැකියාවක් තිබිය යුතුය.

(ඇ) නාගරික සීමාව තුළ පදිංචිකරුවකු හෝ එකී සීමාව තුල කාර්යාලයක් හෝ වෙළඳ ව්‍යාපාරයක් තිබෙන අයෙකු විය යුතුය.

(ඈ) එක් පොතක් ගෙනයෑම සඳහා රු. 5 ක් සහ පොත් දෙකක් ගෙනයෑම සඳහා රු. 10 ක් පුස්තකාලයාධිපති වෙත තැන්පත් කළ යුතුය.

(ඉ) රු. 25 කට නොඅඩු මාසික කුලියක් ලැබෙන ගෙයක අයිතිකරු හෝ පදිංචිකරු විසින් නිර්දේශකර තිබිය යුතුය.

(2) පොත්පත් බැහැරට දෙන පුස්තකාලයේ සාමාජිකයෙකු ලෙස ඇතුලත් වීම අපේක්ෂා කරන සෑම තැනැත්තෙකු විසින්ම පුස්තකාලයාධිපතිගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රයක ඒ සඳහා අයදුම්පත පිළියෙල කොට පහත සඳහන් අයවලුන්ගෙන් යම් කෙනෙකු ලවා අයදුම්පතට සහතික කිරීමේ අත්සන් ලබා ගෙන ඉදිරිපත් කළ යුතුය. එසේ සහතික කිරීමේ අත්සන තබන ලද තැනැත්තා ඇපකරු වශයෙන් සැළකිය යුතුය.

(අ) ජාතික රාජ්‍යසභා නියෝජිතයෙකු.

(ආ) ගාලු මහ නගර සභාවේ සභිකයෙකු ;

(ඇ) කමිටුවේ සාමාජිකයෙකු ;

(ඈ) ආගමික පූජකවරයෙකු ;

(ඉ) වෛද්‍ය හෝ නීති වෘත්තියෙහි යෙදී සිටින අයෙකු ;

(ඊ) සමාදාන විනිශ්චයකාරයෙකු ;

(උ) වාර්ෂික සිවිල් ලැයිස්තුවේ නම සඳහන් රජයේ නිලධාරියෙකු ;

(ඌ) මහ විද්‍යාලයක විද්‍යාලයාධිපතිවරයෙකු ; හෝ

(එ) පුස්තකාලය පිහිටි ප්‍රදේශයේ පළාත් පාලන ආයතනයේ සීමාව තුළ පදිංචි දැනට රුපි. 1,500 කට නොඅඩු වාර්ෂික මූලික වැටුපක් ලබන පළාත් පාලන සේවයේ නිලධාරියෙකු ;

(3) සාමාජිකයා අතින් පොත්පත් නැතිවීම හා වෙනත් කියවීමේ උපකරණ නැතිවීම සම්බන්ධව දඩ ගැන ඇපවන්නා වගකිය යුතු අතර, සාමාජිකයින් දෙදෙනෙකුට වැඩි සංඛ්‍යාවක් සම්බන්ධයෙන් ඔහු ඇපකරු නොවිය යුතුය.

(4) ඉල්ලුම් පතක් සහතික කිරීමට ඉහත (2) වැනි ඡේදය යටතේ සුදුසුකම් ඇති තැනැත්තන්ට තම අයදුම්පත අත්සනින් සහතික කරවා ගැනීම අවශ්‍ය නො කළ යුතුය.

7. පොත්පත් බැහැරට දෙන පුස්තකාලයේ සාමාජිකයකු වශයෙන් ඇතුළත් කරගනු ලබන සෑම තැනැත්තකුටම පුස්තකාලයාධිපති විසින් රුපියල් 5 ක තැන්පත් මුදලට එක් ප්‍රවේශ පත්‍රයකුත්, රු. 10 ක තැන්පත් මුදලට ප්‍රවේශ පත්‍ර දෙකකුත් නිකුත් කළ යුතුය. එසේ නිකුත් කරනු ලැබූ එක් ප්‍රවේශ පත්‍රයක් සඳහා එබඳු තැනැත්තෙකුට එක් පොතක් ලබා ගැනීමට හිමිකම් තිබිය යුතුය.

8. පොත්පත් බැහැරට දෙන පුස්තකාලයේ සාමාජිකයකු විසින් එසේ තමා වෙත නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍රයක් පිට ලබා ගන්නා ලද පොතට වගකිව යුතුය.

9. 7 වන අතුරු ව්‍යවස්ථාව යටතේ පොත්පත් බැහැරට දෙන පුස්තකාලයේ සාමාජිකයෙකු වෙත නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍රයක් නැතිවූ කළ එසේ නැතිවූ බව ඔහු විසින් වහාම පුස්තකාලයාධිපති වෙත දැන්විය යුතුය. එබඳු ප්‍රවේශ පත්‍රයකට කිසිම පොතක් පොත්පත් බැහැරට දෙන පුස්තකාලයෙන් ලබාගෙන නොමැති බවට පුස්තකාලයාධිපති සෑහීමට පත්වන්නේ නම් එම ප්‍රවේශ පත්‍රයේ අනුපිටපතක් ශත 50 ක් අය කොට එම සාමාජිකයා වෙත නිකුත් කළ හැකිය. ප්‍රවේශ පත්‍රය නැතිවූ බව තමා වෙත දන්වූ දින සිට යටත් පිරිසෙයින් දින තිහකට නොඅඩු කාලයක් ගතවූ, විට මිසක පුස්තකාලයාධිපති විසින් එසේ අනුපිටපත් නිකුත් නොකළ යුතුය. අනුපිටපතක් නිකුත් කිරීම නිසා සාමාජිකයෙකු වෙත ආරම්භයේදී නිකුත් කරන ලද මුල් ප්‍රවේශ පත්‍රය පිට කවර කලෙක හෝ ලබාගත හැකි පොත් සම්බන්ධයෙන් එකී සාමාජිකයා සතු වගකීමෙන් ඔහු නිදහස් නොවිය යුතුය.

10. පොත් ලබාගන්නා සාමාජිකයෙකුගේ පදිංචියේ හෝ රාජකාරි ලිපිනයේ වෙනස්වීමක් සිදු වුවහොත් එබඳු වෙනස්වීමක් සිදුවී සතියක් ඇතුළත එම වෙනස්වීම පුස්තකාලයාධිපති වෙත ලියා දැනුම්දිය යුතුය. එසේ නොදැන් වුවහොත් බාහිර පාඨකයාගේ තැන්පත් මුදල් හා ප්‍රවේශ පත්‍ර ඔහුට අහිමිවන අතර පුස්තකාලයාධිපතිගේ අභිමතය පරිදි ප්‍රවේශ පත්‍ර අවලංගු කළ හැකිය.

11. නාගරික සීමාව තුළ පදිංචියෙන් ඉවත්වී යන බාහිර පාඨකයින්ගේ ප්‍රවේශ පත්‍ර පුස්තකාලයාධිපති වෙත අවලංගු කිරීම සඳහා යැවිය යුතුය. එසේ නොකළහොත් ඔවුන්ගේ නම්වලින් ගනු ලබන පොත්වලට ඔවුන් වගකිව යුතුය.

12. සෑම අවුරුද්දකම සාමාජිකත්වය අළුත්වැඩියා කරගත යුතුය. එසේ අළුත්කර ගැනීම සඳහා අළුතින් මුදල් තැන්පත් කිරීමක් අවශ්‍ය නොවුවද සාමාජිකත්වය අළුත්කර ගැනීම සඳහා වූ පොදු ඉල්ලුම්පත සම්පූර්ණ කොට අතුරු ව්‍යවස්ථාවල 6 (2) (අ) සිට (එ) දක්වා සඳහන් කර ඇති අයෙකු ලවා ඇයදුම්පත් සහතික කරවා ගත යුතුය.

13. සාමාජිකයෙකු විසින් පොත්පත් බැහැරට දෙන පුස්තකාලයකින් ලබාගන්නා ලද යම්කිසි පොතක් එය එසේ ලබාගන්නා ලද දිනයේ සිට දින දහහතරක් ඇතුළතදී පුස්තකාලයාධිපති වෙත ආපසු භාරදිය යුතුය. වෙනත් සාමාජිකයෙකුහට අවශ්‍ය නොවන්නේ නම් එම පොත එම සාමාජිකයාටම තවදුරටත් දින දහහතරක කාල සීමාවක් සඳහා දීමට පුස්තකාලයාධිපතිට හැකිය. පෞද්ගලිකව හෝ ඇපකරු මගින් පුස්තකාලය වෙත ඉදිරිපත් කිරීමෙන් පොත් ලබා ගැනීම එසේ අළුත් කළ යුතුය.

14. පොත්පත් බැහැරට දෙන පුස්තකාලයෙන් සාමාජිකයෙකු විසින් ලබා ගන්නා ලද පොතක් 13 වෙනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් දින දහහතරක කාල සීමාව ඇතුළත භාරදීමට අපොහොසත් වන සාමාජිකයෙකු විසින් පොත භාරදීම ප්‍රමාද වන එක් එක් දවසට ශත 10 බැගින් වූ දඩ මුදලක් ගෙවීමට ඔහු බැඳී සිටිය යුතුය.

15. සාමාජිකයෙකු විසින් පොත්පත් බැහැරට දෙන පුස්තකාලයෙන් ඉල්ලා ගෙන යන ලද යම් පොතක් එසේ ඉල්ලාගෙන යන ලද දින සිට දින 30 ක් අතුළත පුස්තකාලය වෙතආපසු භාරදීමට අපොහොසත් වුවහොත්, එම පොත හෝ පුස්තකාලයේ බලධාරීන්ගේ අභිමතය පරිදි එහි වටිනාකම සමඟ නඩු ගාස්තු ද 14 වැනි අතුරු ව්‍යවස්ථාවට අනුව එසේ නිසි දින ආපසු භාර දී නැති පොත් සඳහා ගෙවිය යුතු නිවර්තන ගාස්තුවද නීති මගින් සාමාජිකයාගෙන් හෝ ඇපකරුගෙන් අයකර ගැනීම සඳහා පියවර ගැනීමට පුස්තකාල බලධාරීන්ට හිමිකම් තිබිය යුතුය.

16. පොත්පත් බැහැරට දෙන පුස්තකාලයෙන් තමන් විසින් ලබා ගන්නා ලද යම් පොතකට කිසිම අන්දමේ හානියක් හෝ අලාභයක් සාමාජිකයා විසින් නොකළ යුතුය. සාමාජිකයින් විසින් පොත් පිරිසිදුව තැබිය යුතුය. පොත්වල පිටු නැමීම, පැන්සල් ලකුණු හෝ වෙනත් ලකුණු ඇමීම නොකළ යුතුය.

17. පොත්පත් බැහැරට දෙන පුස්තකාලයෙන් තමන් ඉල්ලා ගැනීමට අපේක්ෂා කරන යම් පොතක කිසියම් අන්දමේ හානියක් හෝ පලුද්දක් ඇත්තේ නම් එය පුස්තකාලයාධිපති වෙත දැනුම්දීම සෑම සාමාජිකයෙකුගේම යුතුකමක් විය යුතුය. එම පලුද්ද හෝ හානිය පුස්තකාලයාධිපති වෙත දන්වීමට ඔහු අපොහොසත් වුවහොත් එම පොත ඔහුට කිසිම හානියක් හෝ අලාභයක් නොමැතිව නිකුත් කරන ලද්දේ සැලකිය යුතුය.

18. සාමාජිකයකු විසින් ආපසු ගෙනවිත් භාරදෙන ලද යම් පොතක් කිලුටුවී (සාමාන්‍ය වැහැරීම හා ගෙවීයාම හැරෙන්ට) එහි යම් යම් දේ ලියා, ලකුණුකොට හෝ වෙනත් අන්දමකින් පළුදුකොට ඇති බවට පුස්තකාලයාධිපති සෑහීමට පත්වන්නේ නම් සාමාජිකයා විසින් එම පොත හෝ එය අයත් පොත් පන්තිය වහාම අළුතින් සැපයීම හෝ එහි වටිනාකම ගෙවීම හෝ නගරාධිපතිවරයා විසින් පැනවීමට සුදුසුයයි සලකනු ලබන වෙනත් දඬුවමකටද යටත් වීම හෝ කළ යුතුය. එසේ කිරීම ප්‍රතික්ෂෙප කළහොත් හෝ අතපසු කළහොත් හෝ එම වටිනාකම නීති මාර්ගයෙන් හාඩු ගාස්තුවද සමග අයකර ගත හැකිය. පළුදුවූ පොතක් හෝ පොත් කට්ටලයක් සඳහා අළුතින් පිටපත් සැපයීම හෝ වටිනාකම ගෙවීම කරනු ලැබූ විටක එසේ සැපයීම හෝ ගෙවීම කරනු ලබන තැනැත්තාට "මහජන පුස්තකාලය .....හානිවී ඇති බැවින් විකුණන ලදී" යන වචනවලින් යුත් මුද්‍රාව තැබීමෙන් පසුව එසේ පලුදුවූ පිටපත සඳහා හිමිකම් ලැබිය යුතුය.

19. (1) පොත්පත් බැහැරට දෙන පුස්තකාලයෙන් ඉල්ලාගත් කිසිම පොතක් කිසිම සාමාජිකයකු විසින් වෙනත් තැනැත්තෙකුට නොදිය යුතුය.

(2) මෙම අතුරු ව්‍යවස්ථාවේ (1) වැනි ඡේදයේ විධිවිධාන උල්ලංඝනය කරන යම් සාමාජිකයෙකුට ඔහුගේ තැන්පත් මුදල අහිමි විය යුතු අතර පොත්පත් බැහැරට දෙන පුස්තකාලයේ ඔහුගේ සාමාජිකත්වයද අහෝසි විය යුතුය.

20. විසන්ගත රෝගයකින් හෝ ස්පර්ශයෙන් බෝවෙන රෝගයකින් පෙළෙන තැනැත්තකු පාවිච්චි කළ බව තමා දන්නා යම් පොතක් කිසිම සාමාජිකයකු විසින් පොත්පත් බැහැරට දෙන පුස්තකාලයට ආපසු බාර නොදිය යුතුය. එබඳු අවස්ථාවකදී එබඳු පොතක් විනාශ කළ යුතු අතර, ඒ පොත වෙනුවට අළුත් පොතක් සැපයීමට යන වියදම හෝ එය අයත් පොත් පන්තිය සැපයීමට යන වියදම හෝ පුස්තකාලයාධිපතිගේ අභිමතය පරිදි ඒවායේ වටිනාකම හෝ සාමාජිකයා විසින් පුස්තකාලයාධිපතිට ගෙවිය යුතුය.

21. යම්කිසි පොතක් කවර සාමාජිකයකුට ලැබිය යුතුද යන්න පිළිබඳව පුස්තකාලයේ සාමාජිකයන් දෙදෙනකු හෝ ඊට වැඩි දෙනෙකු අතර ආරාවුලක් ඇතිවූ කල්හි පුස්තකාලයාධිපති විසින් ඒ ආරාවුල විසඳිය යුතුය.

22. වෙන සාමාජිකයෙකු විසින් ලබාගෙන ඇති පොතක් ඔහුගෙන් පසු ලබාගැනීමට කැමැති යම් සාමාජිකයකු විසින් තමාගේ නමත් ඒ පොතේ නමත් ඒ සඳහා තබා තිබෙන ලේඛනයෙහි ඇතුළත් කළ යුතු අතර, ඒ පොත එවකට ලබාගෙන සිටි සාමාජිකයා එය ආපසු ගෙනැවිත් භාරදුන් විට, පුස්තකාලයාධිපති විසින් ලේඛනයේ නම ඇතුළත් කළ සාමාජිකයාට එය නිකුත් කළ යුතුය. යම් පොතක් සඳහා සාමාජිකයන් දෙදෙනෙක් හෝ ඊට වැඩි ගණනක් ලේඛනයෙහි නම් ඇතුළත් කර ඇති විට, ඒ නම් ලේඛනයෙහි ඇතුළත් කර ඇති පිළිවෙල අනුව ඔවුන්ට ඒ පොත නිකුත් කළ යුතුය.

23. 6(1) (ඇ) අතුරු ව්‍යවස්ථාව යටතේ යම්කිසි තැනැත්තෙකු විසින් ගෙවා ඇති තැන්පත් මුදල පොත්පත් බැහැරට දෙන පුස්තකාලයට ඔහුගෙන් අයවිය යුතු යම් මුදලක් ඇතොත් එය අඩුකර ගෙන, ඒ තැනැත්තාගේ සාමාජිකත්වය අවසන් වීමේදී, ඔහුට ආපසු ගෙවිය යුතුය.

### ආශ්‍රය පුස්තකාලය

24. කිසිම තැනැත්තෙකු විසින්—

(අ) ඒ සඳහා පුස්තකාලයාධිපතිගෙන් අවසර ලබා ගෙන ඇති විටක; සහ

(ආ) ආශ්‍රය පුස්තකාලයෙහි තබා තිබෙන ලේඛනය අත්සන් තබා ඇති විටක;

මිස ආශ්‍රය පුස්තකාලය පාවිච්චි නොකළ යුතුය.

25. කිසිම තැනැත්තකු විසින් ආශ්‍රය පරිහරණය සඳහා තමා වෙත නිකුත් කරන ලද යම් පොතක් හෝ ඉන් කොටසක් හෝ යම් පත්‍රිකාවක් හෝ වාර සඟරාවක්, පින්තූරයක්, චිත්‍රයක්, කැටයමක්, සිතියමක්, සටහනක්, සැලැස්මක්, ලේඛනයක්, ලියවිල්ලක් මුද්‍රිත ලියවිල්ලක්, ප්‍රවෘත්ති පත්‍රයක් හෝ ආශ්‍රය පුස්තකාලයට අයත් කවර දෙයක් හෝ ආශ්‍රය පුස්තකාලයෙන් පිටත නොගෙන යා යුතුය.

### කියවීම් ශාලාව

26. කිසිම තැනැත්තෙකු විසින්—

(අ) ඒ සඳහා පුස්තකාලයාධිපති ගෙන් අවසර ලබාගෙන ඇති විටක; සහ

(ආ) කියවීම් ශාලාවේ තබා තිබෙන ලේඛනය අත්සන් තබා ඇති විටක;

මිස, කියවීම් ශාලාව පාවිච්චි නොකළ යුතුය.

27. කිසිම තැනැත්තකු විසින් කියවීම් ශාලාවට අයත් හෝ එහි තබා තිබෙන හෝ කිසිම ප්‍රවෘත්ති පත්‍රයක්, වාර සඟරාවක්, සඟරාවක් සිතියමක්, ලේඛනයක්, ලියවිල්ලක්, මුද්‍රිත ලියවිල්ලක්, සිතියමක්. සටහනක්, පින්තාරුවක්. චිත්‍රයක්, කැටයමක්, පත්‍රිකාවක් හෝ වෙනත් යම් ද්‍රව්‍යයක් කියවීම් ශාලාවෙන් ඉවතට නොගෙන යා යුතුය.

### සාමාන්‍ය කරුණු

28. බෝවෙන හෝ ස්පර්ශයෙන් බෝවෙන රෝගයකින් හෝ චර්ම රෝගයකින් පෙළෙන්නාවූ හෝ පෙළෙනාවූ හෝ එවැනි රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට මෑතකදී සාත්තු කළාවූ කිසිම තැනැත්තකු එම රෝගය බීජෝෂණය සමය පසුවන තුරු මහජන පුස්තකාලයට අයත් ස්ථානයට ඇතුළත් නොවිය යුතුය.

29. කිසිම තැනැත්තකු විසින්—

(1) මහජන පුස්තකාලයට අයිති ස්ථානය ඇතුළත හෝ ඒ අසල අනිසි ලෙස හැසිරීම හෝ පීඩාවක් ඇතිවන කිසිම දෙයක් කිරීම ;

(2) මහජන පුස්තකාලයට අයිති ස්ථානයේ ගොඩනැගිල්ලට හෝ ගාලු මහ නගර සභාවට අයත් යම් දේපලකට හානියක් කිරීම හෝ එය මොනම අන්දමකින්වත් විරූපි කිරීම ;

(3) පුස්තකාලය වැසීමෙන් පසුව තමා එහි රැඳී සිටීම ගැන සතුටු දායක විස්තරයක් කිරීමට හැකිකමක් නොමැතිව මහජන පුස්තකාලයට අයිති ස්ථානයට ඇතුළුවීම, එහි රැඳී සිටීම හෝ නිකරුණේ ගැවසීම ;

(4) මහජන පුස්තකාලයට අයත් ස්ථානය ඇතුළත දුම්බීම හෝ කෙළ ගැසීම ;

(5) මහජන පුස්තකාලයට අයත් ස්ථානය ඇතුළත දී කැටවලින් හෝ කඩදාසි කුට්ටමින් සූදු කෙළීම හෝ අන් කිසි ක්‍රීඩාවක් කිරීම ;

(6) කෑ ගැසීමෙන් හෝ ගී සින්දු කීමෙන් හෝ අන් කිසි ඝෝෂාවක් කිරීමෙන් මහජන පුස්තකාලය පාවිච්චි කරන්නන්ට කරදර කිරීම ;

(7) අපිරිසිදු ලෙස හෝ නුසුදුසු ලෙස හැඳගෙන මහජන පුස්තකාලයට අයිති ස්ථානයට ඇතුළුවීම ;

(8) මහජන පුස්තකාලයට අයත් ස්ථානයට බල්ලකු හෝ වෙනයම් සතකු ගෙන ඒම ;

(9) මහජන පුස්තකාලයට අයත් ස්ථානයේ යම් තැනක නිදාගැනීම හෝ යම්කිසි ආහාරයක් ගැනීම ;

(10) පුස්තකාලයේ මහජනයා සඳහා වෙන්කර නොමැති කවර කොටසකට හෝ ඇතුළත්වීම් හෝ එහි රැඳී සිටීම ;

(11) තොප්පි, කුඩ, බස්තන්, බෑග්, පාර්සල් හෝ වෙනත් යම් ද්‍රව්‍යයක් පිළිබඳ ආරක්ෂාව සඳහා වගකීම පැවරීම නොකළ යුතුය. එබඳු උපකරණ නැතිවීමක් වුවහොත් එහි වගකීම පොත් රැගෙන යන්නා හෝ පොත් කියවන්නා විසින් දැරිය යුතුය ;

(12) ඕනෑකමින් හෝ නොසැලකිල්ලෙන් හෝ අප්‍රවේසමින් පුස්තකාලයට අයත් යම් පොතක් හෝ ලියවිල්ලක් කිළිටි කිරීම, ඉරා දැමීම, කපා දැමීම, අශෝභන කිරීම, ඒ මත ලිවීම, අලාභහානි කිරීම හෝ විනාශ කිරීම හෝ පුස්තකාලයට අයත් දේපළ, ගෘහ භාණ්ඩ හෝ උපකරණ අනිසි ලෙස පාවිච්චි කිරීම හෝ නොසැලකිලි හෝ අප්‍රවේශම් ලෙස විරූප කිරීම, හානි කිරීම හෝ විනාශ කිරීම කිසිම තැනැත්තෙකු විසින් නොකළ යුතුය ;

(13) මෙම අතුරු ව්‍යවස්ථා යටතේ තමා වෙත පැවරී ඇති බලතල නීත්‍යානුකූලව පාවිච්චි කිරීමේදී, පුස්තකාලයාධිපතිට හෝ ඔහුගේ අණ පරිදි ක්‍රියාකරන යම් නිලධාරියකුට අවහිර කිරීම කිසිම තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.

30. යම් තැනැත්තෙකු විසින් පුස්තකාලයට අයත් ස්ථානයේ දී

(ඉ) අනිසි ලෙස හැසිරීම ;

(ආ) සාහසික, පරුෂ හෝ අවිනීත වචන පාවිච්චි කිරීම ;

(ඉ) ඔට්ටු ඇල්ලීම හෝ දූ කෙළීම කරන විට ද,

පුස්තකාලය වැසීමට නියමිත කාලයෙන් පසු, ඉන් පිටවන ලෙස අවවාද කර තිබිය දී තවත් එහි රැඳී සිටින විට ද පුස්තකාලය පාවිච්චි කිරීමට බලයක් නොමැති හෝ බෝවෙන හෝ ස්පර්ශයෙන් බෝවෙන රෝගයකින් පෙළෙන විට ද ඔහු පුස්තකාලයේ බලධාරීන්ගේ නිලධාරියකු හෝ සේවකයකු විසින් ඉවත් කළ හැකිය.

31. පුස්තකාලයාධිපතිගේ වැඩ කරන කාලය පැය 6½ ඉක්ම නොයා යුතුය. දිවා භෝජනය සඳහා වෙන් වන කාලය පැයකට වැඩි නොවිය යුතු ය.

32. 19, 25, 27, 28, 29 හා 30 අතුරු ව්‍යවස්ථා උල්ලංඝනය කරන සෑම අවස්ථාවකදීම රු. 50 කට වැඩි නොවන දඩයක් පැනවීමෙන් දඬුවම් පැමිණවිය හැකි ය.

33. වෙනත් ලෙසකින් අදහස් කරන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවල සඳහන් "පුස්තකාලයාධිපති" යන වචනයෙන් පුස්තකාලය භාරව සිටීම සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන තැනැත්තා සහ ඔහුගේ සහකාරයින් අදහස් කෙරේ.

3–12—73.03.02 දින අංක 49 දරණ ගැසට් පත්‍රය

---

### දළුගම සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 152 සහ 156 දරණ වගන්ති යටතේ, දළුගම සුළු නගර සභාව විසින් සම්පාදිතව, ඒ ආඥාපනතේ 153 වැනි වගන්තිය යටතේ තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

1973.2.13 වැනි දින,
කොළඹදී ය.

### අතුරු ව්‍යවස්ථාව

### කසල ශෝධනය

සභාව විසින් පිළිගනු ලැබූ සම්මත අතුරු ව්‍යවස්ථාවන්හි XIX වැනි කොටසේ 6 වැනි අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා සභාවට මාස්පතා ගෙවිය යුතු කසල ශෝධන ගාස්තුව, ශෝධනය කරනු ලබන එක් එක් බාල්දිය වෙනුවෙන් රුපියල් දෙක බැගින් විය යුතුය.

3–13—73.03.02 දින අංක 49 දරණ ගැසට් පත්‍රය

---

### ගම්සභා ආඥාපනත

(257 වැනි අධිකාරය වන) ගම් සභා ආඥාපනතේ 42 වැනි වගන්තිය යටතේ බදුල්ල දිස්ත්‍රික්කයේ තැන්නේකුඹුර ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් සම්පාදිතව, ඒ වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමැතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

1973 පෙබරවාරි මස 19 වැනි දින,
කොළඹ දී ය.

### අතුරු ව්‍යවස්ථාව

ගම් සභාව විසින් පිළිගත්තාලද ජල සම්පාදන සේවය පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා, තැන්නේකුඹුර ගම් සභාවට අදාල වන තාක් පමණට එහි 27 (2) වැනි අතුරු ව්‍යවස්ථාවට ඉක්බිතිව පහත සඳහන් අළුත් ඡේදය ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"(3) සභාව විසින් පිහිටුවනු ලැබූ ජල සම්පාදන සේවයෙන් යම් ස්ථානයකට පුද්ගලිකව ජල නලයක් සවිකර දෙනු ලැබූ අවස්ථාවක එකී ස්ථානයේ අයිතිකරු හෝ පදිංචිකරු වෙත යථා පරිදි දැන්වීමක් බාරකරනු ලැබූ විට යම් ව්‍යාපාරයක කාර්යයක් සඳහා ජලය භාවිතා කරනු ලැබේ නම් සවි කරනු ලබන එක් එක් අඟල් භාගයේ කරාමයක් වෙනුවෙන් රුපියල් පහක ගාස්තුවක්ද, යම් ගෘහ කාර්යයක් සඳහා ජලය භාවිතා කරනු ලැබේ නම් සවි කරනු ලබන පළමුවන අඟල් භාගයේ කරාමය වෙනුවෙන් රුපියල් පහක්ද, ඊට අමතරව එම ස්ථානයේ සවි කරනු ලබන සෑම අඟල් භාගයේ කරාමයක් වෙනුවෙන් රුපියල් දෙකයි ශත පණහක්ද එකී ජල සම්පාදන සේවයෙන් ලබාගන්නා ජලය සඳහා සෑම මසකම ගෙවිය යුතුය."

3–171—73.03.02 දින අංක 49 දරණ ගැසට් පත්‍රය

# විවිධ දැන්වීම්

## අම්බලන්තොට සුළු නගර සභාව

### ජල භීතිකා රෝගය

අම්බලන්තොට සුළු නගර සීමාව තුල ජලභීතිකා රෝග උවදුර පවතින බැවින්, එම නගරය තුල පිහිටි පෞද්ගලික ගොඩනැගිල්ලක, ගෙමිදුලක හෝ ගෙවත්තක නොවන්නාවූ අන්‍ය ප්‍රසිද්ධ ස්ථානයක හෝ පාරක හමුවන දඩාවතේ යන නැතහොත් බැඳ නොතබන ලද්දාවූ හෝ දක්කාගෙන නොයනු ලබන්නාවූ කිසියම් සුනඛයකු (බල්ලකු හෝ බැල්ලියකු) මා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලබන අයකු විසින් එවේලේම විනාශ කරනු ලබන බව, ලංකාවේ ව්‍යවස්ථාපිත ප්‍රඥප්ති සංග්‍රහයේ (476 වෙනි පරිච්ඡේදය වන) ජල භීතිකා ආඥා පනතේ 11 වැනි වගන්තියේ ප්‍රකාර මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

මෙම ප්‍රකාශනය ගැසට් පත්‍රයෙහි පළවන දින සිට හයමාසයක කාලයක් බලපවත්වනවා ඇත.

එච්. ජී. ආනන්ද,
සභාපති,
අම්බලන්තොට සුළු නගර සභාව.

1973 පෙබරවාරි මස 8 වැනි දින,
අම්බලන්තොට,
සුළු නගර සභා කාර්‍යාලයේදීය.

3-6—73.03.02 දින අංක 49 දරණ ගැසට් පත්‍රය

---

## කුරුණෑගල දිස්ත්‍රික්කයේ පන්නල ගම් සභාව

### ගෝඝාතක ආඥාපනත

ගෝඝාතක ආඥාපනතේ (272 වැනි අධිකාරයේ) 17 (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලයේ ප්‍රකාර නියමිත බලධාරියා වූ පන්නල ගම්සභාවේ සභාපති, ආර්. එම්. නවරත්න රමානායක වන මම, 1973 වර්ෂයේ පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් දිනයන්හි පන්නල ගම්සභා ප්‍රදේශ සීමාව තුළ මස් පිණිස සතුන් මැරීම හා මස් වෙළඳාම් කිරීම මෙයින් සම්පූර්ණයෙන්ම තහනම් කරමි.

### උපලේඛනය

1973 ජනවාරි 3, 11, 18, 25.
1973 පෙබරවාරි 2, 10, 16, 24.
1973 මාර්තු 4, 11, 18, 26.
1973 අප්‍රේල් 2, 9, 16, 25.
1973 මැයි 2, 9, 16, 24, 31.
1973 ජූනි 7, 14, 23, 29.
1973 ජූලි 6, 14, 22, 29.
1973 අගෝස්තු 5, 13, 21, 27.
1973 සැප්තැම්බර් 4, 11, 19, 25.
1973 ඔක්තෝබර් 4, 11, 18, 25.
1973 නොවැම්බර් 2, 9, 16, 23.
1973 දෙසැම්බර් 2, 9, 16, 23.

ආර්. එම්. නවරත්න රාමනායක,
සභාපති,
පන්නල ගම්සභාව.

1973 පෙබරවාරි 14 වැනි දින,
පන්නල ගම්සභා කාර්‍යාලය,
යක්විල.

3-61—73.03.02 දින අංක 49 දරණ ගැසට් පත්‍රය

---

## විශේෂ කොමසාරිස් කාර්‍යාලය—අම්බලන්ගොඩ නගරය

### පළාත් ආණ්ඩු සභා ආඥාපනත 255 වන අධිකාරය

(255 වන අධිකාරය) පළාත් ආණ්ඩු සභා ආඥාපනතේ 162, 164 වන වගන්ති යටතේ අම්බලන්ගොඩ විශේෂ කොමසාරිස් විසින් 9-1002/3-72.09.29 දින අංක 27 දරණ ශ්‍රී ලංකා ජනරජයේ පළාත් පාලන ගැසට් පත්‍රයෙහි ප්‍රකාශිත බලපත්‍ර ගාස්තු වලට අමතරව මෙහි පහත සඳහන් උප ලේඛනයෙන් විස්තර කෙරෙන බලපත්‍ර ගාස්තු වද පනවා ආදේශ කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කෝලිත වල්ගමගේ,
විශේෂ කොමසාරිස්— අම්බලන්ගොඩ නගරය.

73. 01. 29 වන දින,

### උපලේඛනය

| බලපත්‍රයේ ස්වභාවය | වාර්ෂික ගාස්තු |
|---|---|
| 1. පලතුරු වෙළඳාම | රු 10.00 |

3-526—73.03.02 දින අංක 49 දරණ ගැසට් පත්‍රය

---

## ගලේවෙල සුළු නගර සභාව

### 1973 වර්ෂය සඳහා වරිපනම් ලේඛන

1973 වර්ෂය සඳහා මෙම සුළු නගර සභාවේ වරිපනම් ලේඛන දැනට සූදානම්කර ඇති බවත්, එම ලේඛන මෙම කාර්යාලයේදී කාර්යාල වේලාවන්හිදී බදු ගෙවන්නන්ට පරීක්ෂාකර බැලීම සඳහා තබා ඇති බවත්, සුළු නගර සභා ආඥාපනතේ (256 වැනි අධිකාරය) 165 වන වගන්තිය හා මහ නගර සභා ආඥාපනතේ (252 වන අධිකාරය) 235 (1) වන වගන්තිය යටතේ මහජනයා වෙත මෙයින් දැනුම්දෙමි.

ල. ජ. ද සිල්වා වික්‍රමසූරිය,
සභාපති,
ගලේවෙල සුළු නගර සභාව.

1973 ක්වූ පෙබරවාරි මස 14 වන දින,
ගලේවෙල සුළු නගර සභා කාර්යාලයේ දී ය.

3-9—73.03.02 දින අංක 49 දරණ ගැසට් පත්‍රය

---

## 1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා පනත — කොදගොඩ ගම්සභාව

"1952 අංක 6 දරණ ප්‍රාදේශාධිකාරී පොදු අතුරු ව්‍යවස්ථා ආඥා පනතේ 3 වැනි වගන්තියේ 1 වෙනි උප වගන්තිය යටතේ කෝදගොඩ ගම් සභාව විසින් 1954 මැයි 14 වෙනි දින අංක 10,672 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද යෝජනාවෙන් සම්මත කරගන්නා ලද පොදු අතුරු ව්‍යවස්ථාවල 4 වෙනි කාණ්ඩයේ 1 වෙනි අතුරු ව්‍යවස්ථාව ප්‍රකාර මෙහි පහත දැක්වෙන මංමාවත් එකිනෙක ඉදිරියේ සඳහන් දිග හා පළල අනුව සාදා හෝ නැවත සාදා පවත්වා ගෙන යා යුතුයයි මෙම සභාව යෝජනා කරන්නීය" යන යෝජනාව අංක 4 ඇල්ලලගොඩ නියෝජිත ඊ. සී. පී. පොබානන්ද මහතාගේ යෝජනාවෙන් හා උප සභාපති ඩේවිඩ් දෙලපල මහතාගේ සම්රත්ව යෙන් සභා සම්මත විය.

කොට්ඨාශය : අංක 4 ඇල්ලලගොඩ.

පාරේ නම : දංගරගොඩවත්ත පාර ; දිග : දම්වැල් 30 අඩි 20 ; පළල : අඩි 10.

ඇන්. ඇම්. නිමල් සාන්ත,
කෝදාගොඩ ගම් සභාවේ සභාපති.

1973.02.08 දින,
කෝදගොඩ ගම් සභා කාර්යාලය,
ඉමදූව.

3-36—73.03.02 දින අංක 49 දරණ ගැසට් පත්‍රය

**රාගම සුලු නගරසභාව**

1973 වර්ෂයේ වරිපනම් බදු ලේඛන

1973 වර්ෂය සඳහා වූ මෙම සුලු නගරසභාවේ වරිපනම් බදු ලේඛන සියල්ල සූදානම්ව ඇති බවත්, ඒවා මෙම කාර්යාලයේ දී, කාර්යාල වේලාවන් හි දී මහජනයාට පරීක්ෂාකර බැලිය හැකි බවත්, සු. න. සභා ආඥාපනතේ (256 වන අධිකාරය) 165 වැනි කාණ්ඩය හා සම්බන්ධිත නාගරික සභා ආඥාපනතේ (252 වැනි පරිච්ඡේදය) අංක 235 (1) දරණ වගන්තිය යටතේ මෙයින් දන්වා සිටිමි.

ෂෙල්ටන් ජී. අමරසේකර,
සභාපති,
රාගම සුලු නගර සභාව.

1973 ක් වූ පෙබරවාරි මස 13 වැනි දින,
රාගම, සු. න. ස. කාර්යාලය.

3–46—73.03.02 දින අංක 49 දරණ ගැසට් පත්‍රය

---

**විශේෂ කොමසාරිස් කාර්යාලය—රඹුක්කන නගරය**

1973 වර්ෂයේ වරිපනම් ලේඛණ

1973 වර්ෂය සඳහාවූ රඹුක්කන විශේෂ කොමසාරිස් කාර්යාලයේ වරිපනම් ලේඛණ දැනට සූදානම්ව ඇති බවත්, එම ලේඛණ කාර්යාල වේලාවන් හිදී මහජනයාට පරීක්ෂා කර බැලීම සඳහා තබා ඇති බවත්, (256 වැනි අධිකාරය) වන සුළු නගර සභා ආඥාපනතේ 165 වැනි වගන්තිය සහ (252 වැනි අධිකාරය) වන මහ නගර සභා ආඥාපනතේ 235 (1) දරණ වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

ඩබ්ලිව්. ඩී. සෝමතුංග,
විශේෂ කොමසාරිස්—රඹුක්කන නගරය.

1973 ක් වූ පෙබරවාරි මස 2 දින,
රඹුක්කන විශේෂ කොමසාරිස් කාර්යාලයේ දීය.

3–690—73.03.02 දින අංක 49 දරණ ගැසට් පත්‍රය

---

**1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා පනත (261 වැනි අධිකාරය)**

පළාත් පාලන ආයතන (පොදු ආදශී අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තිය යටතේ මාතර දිස්ත්‍රික්කයේ, මිරිස්ස ගම්සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පළකර සිටිනු ලැබේ.

යෝජනාව

පළාත් පාලන ඇමතිතුමා විසින් සම්පාදනය කරනු ලැබ, 1966 ජූලි මස 28 වැනි දින අංක 14,703 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ සහ නියෝජිත මණ්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1969 ජනවාරි මස 3 වැනි දින අංක 14,835 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදන යෙන් ප්‍රකාශ කරන ලද්දාවූ පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල අංක 39 සිට 41 දක්වා වූ කාණ්ඩද (අංක 39 සහ 41 වැනි කාණ්ඩ දෙකම ඇතුළත්ව) 1972 නොවැම්බර් මස 3 වැනි දින අංක 32 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දාවූ අංක 42 දරණ කොටසේ සඳහන් පොදු ආදශී අතුරු ව්‍යවස්ථාවද, මෙම යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට ක්‍රියාත්මක වන අන්දමින් සම්මත කර ගැනීමට මාතර දිස්ත්‍රික්කයේ, මිරිස්ස ගම්සභාව විසින් ප්‍රාදේශික බල මණ්ඩල (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පිළිබඳ ආඥාපනතේ (261 වැනි අධිකාරය) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ යෝජනාකර සිටිනු ලැබේ.

ඇම්. ආර්නිස්,
මිරිස්ස ගම්සභාවේ සභාපති.

1973 ක් වූ පෙබරවාරි මස 2 වැනි දින,
මිරිස්ස ගම්සභා කායඞාලයේ දීය.
මිරිස්ස.

3–689—73.03.02 දින අංක 49 දරණ ගැසට් පත්‍රය

---

**හික්කඩුව සුළු නගර සභාව**

1973 වෂීයේ වරිපණම් ලේඛණ

1973 වෂීය සඳහා මෙම සුළු නගර සභාවේ වරිපණම් ලේඛණ දැනට සූදානම්ව ඇති බවත්, එම ලේඛණ කාර්යාල වේලාවන් හිදී මෙම කාර්යාලයේ දී පරීක්ෂා කර බැලීම සඳහා තබා ඇති බවත්, 256 වැනි අධිකාරය වූ සුළු නගර සභා ආඥා පණතේ 165 වැනි වගන්තියේ කියවෙන පරිදි 252 වැනි අධිකාරය වූ මහ නගර සභා ආඥා පණතේ 235/1 දරණ වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඇස්. කේ. නන්දිසේන,
හික්කඩුව සුළු නගර සභාවේ සභාපති.

1973 පෙබරවාරි 17 වෙනි දින,
හික්කඩුව සුළු නගර සභා කාර්යාලයේ දී ය.

3–175—73.03.02 දින අංක 49 දරණ ගැසට් පත්‍රය

---

**1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන**

(පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පණත

**තිහගොඩ ගම්සභාව**

පළාත් පාලන ආයතන "පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා" පනතේ 3 වැනි වගන්තිය යටතේ මාතර දිසාවේ තිහගොඩ ගම් සභාවේ පාලන නිලධාරී විසින් ගෙන ඇති පහත දැක්වෙන තීරණය එකී වගන්තියේ ප්‍රකාර මෙහි පළකරනු ලැබේ.

තීරණය.

පලාත් පාලන ඇමති තුමා විසින් සම්පාදනය කරනු ලැබූ 1963 ජූනි මස 21 වැනි දින අංක 13,679 දරණ ගැසට් පත්‍රයේ පලවූ නිවේදනයෙන් ප්‍රකාශයට පත්කරන ලද්දාවූද උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරනු ලැබ 1969 ජනවාරි මස 3 වැනි දින අංක 14,835 දරණ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පමුණුවනු ලැබුවාවූද, එකී අතුරු ව්‍යවස්ථා මාලාවේ 39, 40 සහ 41 වැනි කාණ්ඩ ද මෙම තීරණය ගැසට් පත්‍රයේ පළවූ දින සිට ක්‍රියාත්මක වන අන්දමින් පිළිගැනීමට මාතර දිසාවේ තිහගොඩ ගම්සභාවේ පාලන නිලධාරී විසින් පලාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පණතේ (261 වැනි පරිච්ඡේදය) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් තීරණය කරනු ලැබේ.

එච්. ඒ. එම්. දයාසේන,
පාලන නිලධාරී,
තිහගොඩ ගම්සභාව.

1973 පෙබරවාරි මස 2 වෑනි දින,
තිහගොඩ ගම්සභා කාර්යාලයේ දී ය.

3–525—73.03.02 දින අංක 49 දරණ ගැසට් පත්‍රය

### නුවරඑළිය දිස්ත්‍රික්කයේ නානුඔය ගම්සභාව

**බ්ලැක්පූල් (රුවන්එළිය) දියුණු ගම්මණ්ඩියක් ලෙස ප්‍රකාශ කිරීම**

පහත දැක්වෙන උපලේඛණයෙහි සඳහන් මායිම්වලට සීමාවූ නානුඔය ගම්සභා ප්‍රදේශයේ, බ්ලැක්පූල් (රුවන්එළිය) නගරය දියුණු ගම්මණ්ඩියක් වශයෙන්, ගම්සභා ආඥාපනතේ (257 වෙනි අධිකාරියේ) 37 (2) (ඒ) වගන්තිය යටතේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ සහකාර පළාත් පාලන කොමසාරිස් තුමාගේ අනුමැතිය ඇතිව ප්‍රකාශයට පමුණුවා ඇති බැව් මහජනයාගේ දැනගැනීම සඳහා මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛණය

උතුරු මායිම: "නුවරඑළිය නානුඔය පාරේ අංක 109/14 දරණ බෝක්කුවේ මැද සිට උතුරු දෙසින් නානුඔය ගඟේ මධ්‍ය රේඛාවේ පිහිටි ලක්ෂ්‍යයකු සිට එම මධ්‍ය රේඛාව ඔස්සේ උතුරු දෙසට සහ නැගෙනහිර දෙසටද මීපිලිමාන ඔයේ මධ්‍ය රේඛාව තෙක්ද එතැන් සිට එම රේඛාව ඔස්සේ විදුලි රැහැන් හමුවනතෙක්ද, එතැන් සිට නැගෙනහිර දෙසට එම විදුලි රැහැන් මාර්ගය ඔස්සේ හමුවන ප්‍රථම විදුලි රැහැන් කණුව තෙක්ද,

නැගෙනහිර මායිම: එතැන් සිට මහගස්තොට අඹේවෙල පාර සහ රුවන්එළිය-මහගස්තොට පාර සන්ධිවන ස්ථානයේ සිට නිරිත දෙසින් යාර 100 ක් ඈත්ව රුවන්එළිය මහගස්තොට පාරේ මධ්‍ය රේඛාව පිහිටි ලක්ෂ්‍යයක් වෙතද, එතැන් සිට මධ්‍ය රේඛාව ඔස්සේ රුවන්එළිය මහගස්තොට පාර සහ මහගස්තොට අඹේවෙල පාර සන්ධිවන ස්ථානය තෙක්ද, එතැන් සිට මහගස්තොට අඹේවෙල පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ රුවන්එළිය-අඹේවල පාරේ මධ්‍ය රේඛාව තෙක්ද.

දකුණු මායිම: එතැන් සිට බස්නාහිර දෙසට රජයේ රක්ෂිත වනයේ නැගෙනහිර මායිම තෙක්ද,

බටහිරට මායිම: එතැන් සිට උතුරු දෙසට හා බටහිර දෙසට රජයේ රක්ෂිත වනයේ නැගෙනහිර මායිම ඔස්සේ ධර්මපාලපුර මාවත තෙක් අඳින ලද රේඛාවකකින්ද, එතැන් සිට උතුරු දෙසට නුවරඑළිය-නානුඔය පාරේ අංක 109/14 දරණ බෝක්කුවේ මැද පිහිටි ලක්ෂ්‍යයක් වෙතද, අඳින ලද රේඛාවකින්" මායිම් වූ ප්‍රදේශය.

ආර්. ඇස්. පී. සෝමපාල,
නානුඔය ගම්සභාවේ සභාපති තැන.

1973 ජනවාරි මස,
නානුඔය ගම්සභා කාර්යාලයේදීය.

3–762—73.03.02 දින අංක 49 දරණ ගැසට් පත්‍රය

---

### 1952කේ අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා පනත) (261 වැනි අධිකාරිය)

මූල්ලිපොතාන ගම්සභාව

පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තිය යටතේ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ මූල්ලිපොතාන ගම්සභාව විසින් සම්මත කරගෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පළකර සිටිනු ලැබේ.

#### යෝජනාව

පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ අප්‍රේල් මස 10 වැනි දින අංක 10,517 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ සහ නියෝජිත මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරනලද බව 1953 අගෝස්තු මස 7 වැනි දින අංක 10,560 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල අංක 1 සිට 37 දක්වාවූ කාණ්ඩ (අංක 1 සහ 37 වැනි කාණ්ඩ දෙකම ඇතුළත්ව).

පළාත් පාලන අමාත්‍යතුමා විසින් සම්පාදනය කරනු ලැබ, 1963 ජූනි මස 21 වැනි දින අංක 13,679 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1965 ජනවාරි මස 8 වැනි දින අංක 14,287 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 38 වැනි කාණ්ඩයද,

පළාත් පාලන අමාත්‍යතුමා විසින් සම්පාදනය කරනු ලැබ, 1966 ජූලි මස 8 වැනි දින අංක 14,703 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1969 ජනවාරි මස 3 වැනි දින අංක 14,835 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල අංක 39 සිට 41 දක්වා වූ කාණ්ඩද, (අංක 39 සහ 41 වැනි කාණ්ඩ දෙකම ඇතුළත්ව) මෙම යෝජනාව ගැසට් පත්‍රයේ පලවන දින සිට ක්‍රියාත්මක වන අන්දමින් සම්මත කර ගැනීමට ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ මූල්ලිපොතාන ගම්සභාව විසින් ප්‍රාදේශික බලමණ්ඩල (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පිළිබඳ ආඥාපනතේ (261 වැනි අධිකාරය) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ යෝජනාකර සිටිනු ලැබේ.

වෛ. අබ්දුල් ජබාර්,
මූල්ලිපොතාන ගම්සභාවේ සභාපති.

මූල්ලිපොතාන ගම්සභා කාර්යාලය,
මූල්ලිපොතාන,
1972 නොවැම්බර් මස 15 වැනි දින.

3–17—73.03.02 දින අංක 49 දරණ ගැසට් පත්‍රය

---

### විශේෂ කොමසාරිස් කාර්යාලය, දර්ගානගරය

1973 වරිපනම් ලේඛන

1973 වර්ෂය සඳහා මෙම නගරයේ වරිපණම් ලේඛන දැනට සූදානම්ව ඇති බවත් එම ලේඛන කාර්යාල වේලාවන්හිදී මෙම කාර්යාලයේදී පරීක්ෂා කර බැලීම සඳහා තබා ඇති බවත් (256 වැනි අධිකාරය) වන සුළු නගර සභා ආඥාපණතේ 165 වැනි වගන්තියෙන් කියවෙන පරිදි 252 වැනි අධිකාරයවූ මහ නගර සභා ආඥාපණතේ අංක 235 (1) දරණ වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අයි. ඇල්. ඇම්. මසූර්,
විශේෂ කොමසාරිස්,
දර්ගා නගරය.

විශේෂ කොමසාරිස් කාර්යාලය,
දර්ගා නගරය,
1973 පෙබරවාරි 3 වැනි දින.

3–607—73.03.02 දින අංක 49 දරණ ගැසට් පත්‍රය

---

### කුමාර පල්ලම් පත්තු ගම්සභාව

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත උපලේඛනයේ සඳහන් අය එහි සඳහන් ස්ථානයේ 1973 වර්ෂයට මස් කඩ පවත්වාගෙන යාමට ඉල්ලුම් කර තිබෙන බවත්, මෙම බලපත්‍ර නිකුත්කිරීම ගැන, පුත්තලම් දිස්ත්‍රික්කයේ, කුමාර පල්ලම් පත්තු ගම්සභා ප්‍රදේශය තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම්, ඒ කුමන කරුණක් නිසාද යන වග ඇතුළත් ලියවිල්ලක්, පිටපත් දෙකක් සහිතව, ලියාපදිංචි කළ තැපෑලෙන්, මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට සති දෙකක් ඇතුළත ලියා එවීමට බලය තිබෙන බවත්, මස්පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වැනි පරිච්ඡේදය) අංක 7 (2) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | ස්ථානය |
|---|---|
| ආර්. ඇම්. පැට්රික්, මුණමල් දෙනිය | පල්ලම පිහිටි, විලියම්ස් ගොඩ නැගිල්ල පිහිටි ඉඩම. |

පී. ඇම්. පුන්සිරි,
සභාපති,
කුමාර පල්ලම් පත්තු ගම්සභාව.

ගම්සභා කාර්යාලය,
පු/පල්ලම,
සලාවත.
1973.02.12.

3–3—73.03.02 දින අංක 49 දරණ ගැසට් පත්‍රය

### කුරුණෑගල දිස්ත්‍රික්කයේ දෙඩම්ගස්ලන්ද ගම්සභාව

#### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත විස්තර දක්වෙන උපලේඛනයේ සඳහන් අය විසින් 1973 වර්ෂයට මස් කඩයක් පවත්වා ගෙන යාමට බලපත්‍ර ඉල්ලුම් කර සිටින බවත් ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීමට දෙඩම්ගස්ලන්ද ගම්සභා ප්‍රදේශය තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළ වූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 අධිකාරය) 7 වෙනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩබ්ලිව්. ඇම්. පියසේන,
දෙඩම්ගස්ලන්ද ගම්සභාව.

1973 පෙබරවාරි මස 14 වැනි දින,
ගම්සභා කාර්යාලය.

#### උපලේඛනය

| | ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|---|
| 1. | ඇන්. තාජුදීන්, තෙළඹුගල්ල, දෙඩම්ගස්ලන්ද ... ... ... | එළහරක් මස් ... ... | තෙළඹුගල්ල |

3–8—73.03.02 දින අංක 49 දරණ ගැසට් පත්‍රය

---

### දෙම්පෙ–මාපිටිගම ගම් සභාව

#### ගෝ ඝාතක ආඥාපනත

මෙහි පහත උපලේඛනයෙහි සඳහන් අය විසින් එහි විස්තර සඳහන් පරිදි 1973 වර්ෂය ට මස් පිණිස සතුන් මරා විකිණීමට බලපත්‍රයක් ඉල්ලා අයදුම් පත්‍රයක් මා වෙත ඉදිරිපත් කර ඇති බව ගෝඝාතක ආඥාපනතේ (272 වැනි අධිකාරය) 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී බලපත්‍රය නිකුත් කිරීම ගැන දෙම්පෙ–මාපිටිගම ගම්සභා සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇ එසේ විරුද්ධ වන්නේ කුමන හේතූන් නිසාද යන බව සඳහන් කර දෙපිටපතකින් යුත් ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළ වූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත එවිය යුතු බව මෙයින් දැනුම් දෙමි.

#### උපලේඛනය

| | ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාමේ ස්වභාවය | ස්ථානය |
|---|---|---|---|
| 1. | ඇම්. ඇස්. ඇම්. නෙයිනා මොහමඩ්, 24/10, වේලුවන ටේ‍රස්, බේස්ලයින් පාර, කොළඹ 9 ... ... | ගව මස් ... | දෙම්පෙ |

කේ. ඩී. චන්ද්‍රපාල,
දෙම්පෙ–මාපිටිගම ගම්සභාවේ සභාපති.

1973 ජනවාරි මස 30 වැනි දින,
දෙම්පෙ,
දෙම්පෙ–මාපිටිගම ගම්සභා කාර්යාලයේ දී ය.

3–682—73.03.02 දින අංක 49 දරණ ගැසට් පත්‍රය

---

### උඩුනුවර කඳුපළාත ගම්සභාව

#### ගෝඝාතක ආඥාපනත

මෙහි පහත දැක්වෙන උපලේඛනයෙහි නම් සඳහන් අය විසින් එකී උපලේඛනයෙහි සඳහන් ස්ථානයෙහි 1973 වර්ෂයට මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා අවසර පත්‍රයක් ඉල්ලා අයදුම්පතක් මා වෙත එවා තිබෙන බව ගෝඝාතක ආඥාපනතේ (272 වැනි අධිකාරය වන) 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එම බලපත්‍රය නිකුත් කිරීම ගැන මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර කඳුපළාත ගම් ප්‍රදේශයේ ගම්සභා සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධවන්නේ නම්, ඔහු හෝ ඇය එසේ විරුද්ධ වන්නේ කුමන කරුණු නිසා ද යන වග සඳහන් කර ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට 14 දිනක් ඇතුළත දී මා වෙත එවිය යුතු බව මෙයින් දැනුම් දෙමි.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාමේ ස්වභාවය | ස්ථානය |
|---|---|---|
| වී. ඒ. කාසිම් මහතා, කුරුකුත්තල, කඩුගන්නාව ... ... | එළහරක් මස් ... | ගල්පිහිල්ලේ කුඩා පිනුම්වල, කුරුකුත්තල, කඩුගන්නාව. |

යූ. එල්. නූර් මොහමඩ්,
සභාපති,
උඩුනුවර කඳුපළාත ගම්සභාව.

1973 පෙබරවාරි මස 20 දින,
ඇල්පිටිකන්ද, වෙලම්බොඩ,
උඩුනුවර කඳුපළාත ගම්සභා කාර්යාලයේ දීය.

3–131—73.03.02 දින අංක 49 දරණ ගැසට් පත්‍රය

---

### කෝට්ටේ–ගල්කිස්ස ගම්සභාව

#### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත යටතේ දැන්වීම

මෙහි පහත සඳහන් උපලේඛනයේ දැක්වෙන අය විසින් මස් විකිණීම සඳහා 1973 වර්ෂයට බලපත්‍රයක් ඉල්ලුම්කර තිබෙන බවත්, එම බලපත්‍රය නිකුත් කිරීමට විරුද්ධව කෝට්ටේ–ගල්කිස්ස ගම්සභා ප්‍රදේශය තුළ පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධවන්නේ අසවල් කරුණ නිසායයි දක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකකින් යුතුව, මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවන දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 272 වන් අධිකාරයේ අංක 7 දරන වගන්තියේ ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

**උපලේඛනය**

| | ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය | වෙළඳම |
|---|---|---|---|
| 1. | ඇම්. ඇස්. ඒ. මුනාප් මහතා, අංක 24/1ඒ, විජයබා මාවත, නාවල පාර, නුගේගොඩ ... | මාදිවල පාර, අංක 90, උඩහමුල්ල ... | හරක් මස් |

ඕ. විජයදාස පෙරේරා,
කෝට්ටේ-ගල්කිස්ස ගම්සභාවේ සභාපති.

1973 පෙබරවාරි මස 2 වැනි දින,
කෝට්ටේ-ගල්කිස්ස ගම්සභා කාර්යාලය,
බොරලැස්ගමුව.

3–687—73.03.02 දින අංක 49 දරන ගැසට් පත්‍රය

---

**වැල්ලව ගම්සභා ප්‍රදේශය—කුරුණෑගල දිස්ත්‍රික්කය**

**ගෝඝාතක ආඥපනත**

මෙහි පහත දැක්වෙන උපලේඛනයේ නම් සඳහන් අය විසින් මල්ලවපිටියේ පිහිටි තෙලියගොන්නේ පදිංචි කේ. නූහු ලෙබ්බේ මහතාට අයත් පුද්ගලික ගව ඝාතන මඩුවේදී මරා මස්කර පහත සඳහන් ස්ථානයෙහි 1973 වර්ෂයට මස් කඩයක් පවත්වා ගෙන යාම සඳහා බලපත්‍රයක් ඉල්ලුම්කර ඇති බවත් මෙම බලපත්‍ර නිකුත් කිරීම ගැන කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැල්ලව ගම්සභා ප්‍රදේශය තුළ පදිංචි ඕනෑම කෙනෙකුගේ විරුද්ධත්වයක් ඇත්නම් එය විස්තර සහිතව, පිටපත් දෙකකින් යුක්තව, මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවූ දින සිට දින 14 ක් ඇතුලත මා වෙත ලැබෙන්නට සැලැස්විය යුතු බැව්, ගෝඝාතක ආඥපනතේ (272 අධිකාරය) 7 (2) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

**උපලේඛනය**

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | වෙළඳාම පවත්වාගෙන යන ස්ථානය |
|---|---|---|
| බී. ජේමා, 43/12, ඔඩයාර් මාවත, තෙලියගොන්න, කුරුණෑගල ... | එළ හරක් මස් ... | වැල්ලව ගම්සභාවට අයත්, වැල්ලව පොදු වෙළඳපොලට අයත් මස් කඩය |

කේ. පී. ජයසේන,
වැල්ලව ගම්සභාවේ සභාපති.

1973.2.3 දින,
වැල්ලව ගම්සභා කාර්යාලය,
මරළුවාව, කුරුණෑගල.

3–953—73.03.02 දින අංක 49 දරන ගැසට් පත්‍රය

---

**කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොතුහැර ගම්සභාව**

**මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත**

මෙහි පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් අය විසින් මස් විකිණීම පිණිස 1973 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම් කර තිබෙන බවත් මෙම බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධ වන කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොතුහැර ගම්සභා ප්‍රදේශය ඇතුලත පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධ වන්නේ අසවල් කරුණු සඳහා යයි දැක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සිටින සේ මෙම දැන්වීම " ගැසට් පත්‍රයේ " පලවන දින සිට 14 දිනක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳව ආඥපනතේ (272 වෙනි අධිකාරය) අංක 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය | වෙළඳාම් කරන මස් වර්ගය |
|---|---|---|
| අබ්දුල් මජීඩ් මොහොමඩ් මොහිදීන්, වෙදපොල, පොතුහැර ... | අංක 122, කොළඹ පාර, පොතුහැර ... | එළ හරක් මස් |

බී. ජයසුන්දර,
සභාපති, පොතුහැර ගම්සභාව.

ගම්සභා කාර්යාලය,
පොතුහැර,
1973.2.12.

3 25—73.03.02 දින අංක 49 දරන ගැසට් පත්‍රය

---

**වරකාපොල සුළු නගර සභාව**

**මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත**

මෙහි පහත සඳහන් උපලේඛනයේ දැක්වෙන අය විසින් ඒ අයගේ නම ඉදිරියෙන් සඳහන් ස්ථානයේ, මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා 1973 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම්කර තිබෙන බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීම ගැන වරකාපොල සුළුනගර සභා සීමාව තුළ පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධ වන්නේ අසවල් කරුන මතයයි දැක්වෙන පිටපත් දෙකකින් යුත් ලියවිල්ලකින්, මෙම ගැසට් පත්‍රයේ සඳහන් දින සිට දින 14 ක් ඇතුළත මාවෙත එවන ලෙස ඉල්ලා සිටින බවත්, සෝඝාතක ආඥපනතේ (සංශෝධන ලංකා ව්‍යවස්ථා ප්‍රඥප්තියේ 272 වැනි අධිකාරය) 7 (2) වැනි වගන්තියේ ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩබ්ලිව්. ඒ. ඇල්බට්,
සභාපති,
වරකාපොල සුළු නගරසභාව.

1973 ජනවාරි මස 26 වැනි දින,
වරකාපොල සුළු නගර සභා කාර්යාලයේ දීය.

**උපලේඛනය**

| | ඉල්ලුම්කරුගේ නම | වෙළඳාම | ස්ථානය |
|---|---|---|---|
| 1. | එස්. පී. ඕ. එම්. සාලි ... ... ... ... | හරක් මස් ... | 65, අහුරුවැල්ල පාර, වරකාපොල |
| 2. | එස්. පී. ඕ. එම්. සාලි ... ... ... ... | එළු මස් ... | 65, අහුරුවැල්ල පාර, වරකාපොල |

3–63—73.03.02 දින අංක49 දරන ගැසට් පත්‍රය

**ප්‍රාදේශීය බල මණ්ඩල (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත**

රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමති තුමා විසින් (261 වන අධිකාරය වන) ප්‍රාදේශීය බල මණ්ඩල (සම්මත අතුරු ව්‍යවස්ථා) පණතේ 2 වැනි වගන්තියේ ප්‍රකාර 1972.11.03 වැනි දින අංක 32 දරණ ශ්‍රී ලංකා ජන රජයේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ පලකරන ලද මෙහි පහත සඳහන් සංශෝධිත අතුරු ව්‍යවස්ථාව පිළිගැනීමටත් එය ශ්‍රී ලංකා ජන රජයේ ගැසට් පත්‍රයේ පලවන දින සිට වැල්ලවාය ගම්සභා ප්‍රදේශයේ ක්‍රියාත්මක කිරීමටත් 1973.01.26 වැනි දින පැවැත්වූ වැල්ලවාය ගම් සභාවේ මාසික සභා රැස්වීමේ අංක 3(7) දරණ සභා සම්මුතිය යටතේ වැල්ලවාය ගම්සභාව ඒකමතිකව තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

ආර්. ඩබ්ලිව්. ඒ. ඩී. රණසිංහ,
වැල්ලවාය ගම්සභාවේ සභාපති.

1973.02.01 දින,
වැල්ලවාය ගම්සභා කාර්යාලයේ දීය.

අතුරු ව්‍යවස්ථාව

1966 ජූලි මස 8 වැනි දින අංක 14,703 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද අතුරු ව්‍යවස්ථාවෙන් අවසන් වරට සංශෝධනය කරනු ලැබූ 1953 අප්‍රේල් මස 10 වැනි දින අංක 10,517 දරණ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථාව, එහි XLI දරණ කොටසට පසුව පහත සඳහන් අලුත් කොටස් ඇතුල් කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

**"XLII කොටස"**

පුස්තකාල පිළිබඳ අතුරු ව්‍යවස්ථා

1. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය නොවුවහොත්, මේ අතුරු ව්‍යවස්ථාවල "පුස්තකාලයාධිපති" යන්නෙන් පුස්තකාලය භාරව සිටීම පිණිස සභාව විසින් පත් කරනු ලබන තැනැත්තා අදහස් වන අතර, ඔහුගේ සහකරුවෝද එයට ඇතුලත් වෙති.

2. සභාව විසින් පිහිටුවා පවත්වා ගෙන යනු ලබන මහජන පුස්තකාලය—

(අ) පොත්පත් බැහැරට දෙන පුස්තකාලයකින්,

(ආ) ආශ්‍රය පුස්තකාලයකින්,

(ඇ) කියවීම් ශාලාවකින්, සහ

(ඈ) පහත දැක්වෙන දෑ, එනම්

(i) පුස්තකාලයේ ළමා අංශයක්,

(ii) ප්‍රජා මණ්ඩලවලට සහ ඒ හා සමාන අනුමත ප්‍රජා ව්‍යාපාරවලට තාවකාලික පාවිච්චියට පොත් දීම සහ,

(iii) පළාත් පාලන කොමසාරිස්වරයාගේ පූර්ව අනුමතිය ඇතිව සභාව විසින් අනුමත කරන ලද වෙනත් යම් පුස්තකාල සේවයක්

යන මේවා අතුරින් කවරකින් හෝ සමන්විත වන ව්‍යාප්ත පුස්තකාල සේවයකින්, සමන්විත විය හැකිය.

3. (1) මහජන පුස්තකාලයේ පරිපාලනය හා සාමාන්‍ය පාලනය (මින් පසු මෙහි "කාරක සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන)—

(අ) සභාවේ එවකට සිටින සභාපතිගෙන්,

(ආ) සභාව විසින් තෝරා පත් කරනු ලබන හතර දෙනෙකුට වැඩි නොවූ සභාවේ වෙනත් සාමාජිකයන් ගණනකින්, සහ

(ඇ) සභාව විසින් තෝරා ගනු ලබන සභාවේ පාලන සීමා ඇතුළත පදිංචි ප්‍රසිද්ධ තැනැත්තන් පස් දෙනෙකුගෙන් ද,

යුක්ත වූ පුස්තකාල කාරක සභාවක් වෙත පැවරිය යුතුය.

(2) පුස්තකාලය භාරව සිටිය යුතු පුස්තකාලාධිපතියෙකු සභාව විසින් පත් කළ හැකි අතර, ඒ පුස්තකාලය ඇතුළත මනා විනය පවත්වාගෙන යාම ගැන ඔහු වග කිව යුතුය.

4. (1) සභාවේ සභාපති නිල බලයෙන් කාරක සභාවේ සභාපති විය යුතු අතර, කාරක සභාවේ සෑම රැස්වීමකම මුලසුන ඔහු විසින් දැරිය යුතුය. කාරක සභාවේ යම් රැස්වීමකට සභාපති නොපැමිණි අවස්ථාවක, පැමිණ සිටින සෙසු සාමාජිකයින් විසින් ඒ කාර්යය සඳහා තෝරා ගනු ලබන සාමාජිකයෙකු ඒ රැස්වීමේ මුලසුන දැරිය යුතුය.

(2) යම් රැස්වීමක මුලසුන දරන සාමාජිකයාට මුල් ඡන්දයක් ද, යම් ප්‍රශ්නයක් සම්බන්ධයෙන් දෙන ලද ඡන්ද ගණන සමාන වුවහොත්, තීරක ඡන්දයක් ද හිමිවිය යුතුය.

5. සාමාජිකයින් පස් දෙනෙකුගේ ගණපූර්ණයක් නොමැති වුව හොත් කාරක සභාවේ යම් රැස්වීමකදී කිසිම කටයුත්තක් නොකළ යුතුය.

6. (1) අවශ්‍ය යයි කාරක සභාව විසින් සලකනු ලබන යම් යම් කොන්දේසිවලට යටත් කොට මහජන පුස්තකාලයට අයත් ස්ථානයේ යම් කොටසක් පාවිච්චි කිරීම පිණිස කවර තැනැත්තෙකුට වුව ද අවසර දීමට හෝ පුස්තකාල පිළිබඳ මේ අතුරු ව්‍යවස්ථාවන්ගෙන් යම් කිසිවක් කඩකර ඇති කවර තැනැත්තෙකුට හෝ ඒ ස්ථානයේ කවර කොටසක් වුවද පාවිච්චි කිරීමට අවසර දීම ප්‍රතික්ෂේප කිරීමට කාරක සභාවට බලය තිබිය යුතුය.

(2) දින දෙකක කල් දීමක් ඇතිව සභාපති විසින් කවර හෝ අවස්ථාවක කැඳවනු ලබන රැස්වීම්වලට පුස්තකාල කාරක සභාව රැස්විය යුතුය. එබඳු රැස්වීම්වල ලේකම් වශයෙන් පුස්තකාලයාධිපති කටයුතු කළ යුතුය.

**පොත් පත් බැහැරට දෙන පුස්තකාලය**

7. (1) කිසිම තැනැත්තෙකු—

(අ) වයස අවුරුදු 14 ට නොඅඩු වුවහොත්,

(ආ) අකුරු කියවීමට දනිත හොත්,

(ඇ) සභාවේ පාලන සීමා තුළ පදිංචිව සිටිත හොත් හෝ තමාගේ කාර්යාලයයක් හෝ ව්‍යාපාරික ස්ථානයක් එම සීමා තුළ තිබෙතහොත්,

(ඈ) රුපියල් පහක මුදලක් පුස්තකාලයාධිපති වෙත තැන්පත් කරතහොත්, සහ

(ඉ) රුපියල් විසි පහකට නොඅඩු මාසික කුලියක් ලැබෙන, සභාවේ පාලන සීමා තුළ පිහිටි ගෙයක ප්‍රධාන පදිංචිකරුවෙකු හෝ අයිතිකරුවෙකු විසින් නිර්දේශ කරනු ලබත හොත්,

මිස පොත්පත් බැහැරට දෙන පුස්තකාලයේ සාමාජිකයෙකු වශයෙන් ඔහු ඇතුළත් කර නොගත යුතුය.

(2) පොත් පත් බැහැරට දෙන පුස්තකාලයේ සාමාජිකයෙකු වශයෙන් ඇතුළත් වීමට අදහස් කරන සෑම තැනැත්තකු විසින් ඒ සඳහා පුස්තකාලයාධිපති ගෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රයක ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ යුතු අතර, එකී ඉල්ලුම් පත්‍රය පහත සඳහන් යම් තැනැත්තකු විසින් අනුමත කිරීම වශයෙන් පිටසන් කර තිබිය යුතුය :—

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්,

(ආ) සභාවේ සාමාජිකයෙක්,

(ඇ) පුස්තකාල කාරක සභාවේ සාමාජිකයෙක්,

(ඈ) ආගමික පූජ්‍යවරයෙක්,

(ඉ) වෛද්‍ය හෝ නීතිඥ වෘත්තියෙහි සාමාජිකයෙක්,

(ඊ) සමාදාන විනිශ්චයකරුවෙක්,

(උ) රු. 1,500 කට නොඅඩු වාර්ෂික වැටුපක් ලබන රජයේ සේවකයෙක්,

(ඌ) ද්විතීයික පාසැලක විදුහල්පතිවරයෙක්, හෝ

(ඍ) රුපියල් එක් දහස් පන්සියයකට නොඅඩු වාර්ෂික වැටුපක් ලබන සභාවේ සේවකයෙක්.

(3) ඉහත සඳහන් ඡේදය යටතේ ඉල්ලුම්පත්‍රයක් පිටසන් කිරීමට අයිතිවාසිකමක් ඇති යම්කිසි තැනැත්තෙකුට ඔහුගේ ඉල්ලුම් පත්‍රය පිටසන් කරවා ගැනීම අවශ්‍ය නොවිය යුතුය.

8. පොත් පත් බැහැරට දෙන පුස්තකාලයේ සාමාජිකයෙකු වශයෙන් ඇතුළත් කර ගනු ලැබූ සෑම තැනැත්තෙකුටම පුස්තකාලයාධිපති විසින් අවසර පත්‍ර දෙකක් දිය යුතු අතර ඒ තැනැත්තාට ඒ එක් එක් අවසර පත්‍රය පිට පොතක් ලබා ගෙන බැහැරට ගෙන යාමට හිමිකම් තිබිය යුතුය.

9. පොත්පත් බැහැරට දෙන පුස්තකාලයේ සාමාජිකයෙකු තමාට ලැබී තිබෙන අවසර පත්‍රයක් පිට ඒ පුස්තකාලයෙන් බැහැරට ගෙන යන කවර පොතක් ගැන වුවද වගකිව යුතුය.

10. පොත් පත් බැහැරට දෙන පුස්තකාලයේ සාමාජිකයෙකුට 8 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ දෙන ලද අවසර පත්‍රයක් නැති වූ විට ඒ සාමාජිකයා විසින් වහාම ඒ බව පුස්තකාලයාධිපතිට දැන්විය යුතුය. පොත් පත් බැහැරට දෙන පුස්තකාලයෙන් ඒ අවසර පත්‍රය පිට පොතක් ගෙන ගොස් නැති බවට පුස්තකාලයාධිපති සෑහීමකට පත් වුවහොත්, ඔහු විසින් ඒ සාමාජිකයාට ඒ අවසර පත්‍රයේ දෙවැනි පිටපතක් නිකුත් කළ හැකිය. එහෙත්, ඒ අවසර පත්‍රය නැති වූ බව තමාට දැනුම් දෙන ලද දිනයේ සිට යටත් පිරිසෙයින් තිස් දිනක් ඉකුත් වී ඇතොත් මිස එබඳු දෙවැනි පිටපතක් පුස්තකාලයාධිපති විසින් නිකුත් නොකළ යුතුය.

11. පොත් පත් බැහැරට දෙන පුස්තකාලයෙන් සාමාජිකයෙකු විසින් ලබා ගන්නා ලද යම් පොතක් එය ලබාගත් දින සිට දින දහහතරක් ඇතුළත දී පුස්තකාලයාධිපතිට ආපසු භාර දිය යුතුය. ඒ පොත අන්‍ය සාමාජිකයෙකුට අවශ්‍ය නොවුවහොත්, තවත් දවස් දහහතරක කාල සීමාවකට එය ලබා ගැනීමට පුස්තකාලයාධිපති විසින් ඒ සාමාජිකයාට ඉඩ දිය හැකිය.

12. 11 වැනි අතුරු ව්‍යවස්ථාවේ නිශ්චිතව සඳහන් දින දහහතරේ කාල සීමාව ඇතුළත යම් පොතක් පුස්තකාලයාධිපතිට ආපසු භාර දීමට සාමාජිකයෙකු අපොහොසත් වූ විට, පොත භාරදීම ප්‍රමාදවන එක් එක් දවසකට ශත දහය බැගින් වූ දඩ මුදලක් ගෙවීමට ඔහු බැඳී සිටිය යුතුය.

13. පොත් පත් බැහැරට දෙන පුස්තකාලයෙන් ලබා ගන්නා ලද යම් පොතක් 11 වැනි අතුරු ව්‍යවස්ථාවේ නිශ්චිතව සඳහන් දින දහහතරේ කාල සීමාව ඉකුත් වී තිස් දවසක් ඇතුළත ආපසු භාර දීමට සාමාජිකයෙකු අපොහොසත් වූ විට, ඒ පොත නැතිවූවා සේ සැළකිය යුතුය.

14. සාමාජිකයෙකු විසින් ලබා ගන්නා ලද පොතක් නැති වූ විට හෝ නැතිවූවා සේ සලකනු ලබන විට, ඒ වෙනුවට අළුතින් පොතක් ගැනීම සඳහා යන වියදම ඒ සාමාජිකයා විසින් ගෙවිය යුතුය.

15. පොත් පත් බැහැරට දෙන පුස්තකාලයෙන් ලබා ගන්නා ලද කිසිම පොතකට කිසිම සාමාජිකයෙකු විසින් කිසිම අන්දමක හානියක් හෝ අලාභයක් නොකළ යුතුය.

16. පොත් පත් බැහැරට දෙන පුස්තකාලයෙන් ලබා ගැනීමට තමා අදහස් කරන යම් පොතකට යම් හානියක් හෝ අලාභයක් සිදුවී ඇතොත් ඒ බව පුස්තකාලයාධිපතිට දැනුම් දීම සෑම සාමාජිකයෙකුගේම යුතුකම විය යුතුය. එවැනි යම් හානියක් හෝ අලාභයක් පුස්තකාලයාධිපතිට දැන්වීම ඔහු විසින් පැහැර හරිනු ලැබූ විට, ඒ පොත යම් අලාභයක් හෝ හානියක් සිදුව නැති හොඳ තත්ත්වයෙන් ඔහුට නිකුත් කරන ලද්දේ යයි සැළකිය යුතුය.

17. සාමාජිකයෙකු විසින් ආපසු ගෙනවිත් භාරදුන් පොතකට, එය තවදුරටත් නිකුත් කිරීමට නුසුදුසු වන තරමට ඒ සාමාජිකයා විසින් හානිකර තිබේ යයි පුස්තකාලයාධිපති සෑහීමට පත්වූ විට, ඒ පොත වෙනුවට අළුත් පොතක් ගැනීම පිණිස වියදම ගෙවීමට ඒ සාමාජිකයා බැඳී සිටිය යුතුය. ඒ පොත වෙනුවට එම පොතේ අළුත් පිටපතක් සෙදූ විට. "මහජන පුස්තකාලය—හානි වූ පොතක් වශයෙන් විකුණන ලදී" යන වචන සහිත මුද්‍රාව තබා හානියට පත්වූ පොත ඒ සාමාජිකයාට දිය යුතුය.

18. (1) පොත් පත් බැහැරට දෙන පුස්තකාලයෙන් ලබාගත් කිසිම පොතක් කිසිම සාමාජිකයෙකු විසින් අන් තැනැත්තකුට නොදිය යුතුය.

(2) මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වැනි ඡේදයේ විධිවිධාන කඩ කරන යම් සාමාජිකයකුගේ තැන්පත් මුදල ඔහුට අහිමි විය යුතු අතර බැහැරට දෙන පුස්තකාලයේ ඔහුගේ සාමාජිකත්වයද කෙළවර විය යුතුය.

19. (1) යම් බෝවන රෝගයකින්, ස්පර්ශයෙන් බෝවෙන රෝගයකින් හෝ චර්ම රෝගයකින් පෙළෙන යම් තැනැත්තකු විසින් පාවිච්චි කරන ලදැයි තමා දන්නා කිසිම පොතක් කිසිම සාමාජිකයෙකු විසින් පොත් පත් බැහැරට දෙන පුස්තකාලයට ආපසු භාර නොදිය යුතුය.

(2) පොත් පත් බැහැරට දෙන පුස්තකාලයෙන් සාමාජිකයකු විසින් ලබාගන්නා ලද පොතක් බෝවෙන රෝගයකින්, ස්පර්ශයෙන් බෝවෙන රෝගයකින් හෝ චර්ම රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකු විසින් පාවිච්චි කර ඇති විට, ඒ පොත විනාශ කර දැමිය යුතු අතර, ඒ පොත වෙනුවට අළුත් පොතක් ගැනීම සඳහා යන වියදම ඒ සාමාජිකයා විසින් පුස්තකාලයාධිපතිට ගෙවිය යුතුය.

20. යම් කිසි එක් පොතක් කවර සාමාජිකයකුට ලැබිය යුතුද යන්න පිළිබඳව පුස්තකාලයේදී සාමාජිකයන් දෙදෙනෙකු හෝ ඊට වැඩි දෙනෙකු අතර යම් ආරාවුලක් ඇති වූ විට, පුස්තකාලයාධිපති විසින් ඒ ආරාවුල විසඳිය යුතුවාක් මෙන්ම, ඒ පිළිබඳ ඔහුගේ නිගමනය අවසානාත්මක හා තීරණාත්මක විය යුතුය.

21. වෙන සාමාජිකයෙකු විසින් ලබාගෙන ඇති පොතක් ඔහුගෙන් පසු ලබා ගැනීමට අදහස් කරන කවර සාමාජිකයෙකු වුවද තමාගේ නම සහ ඒ පොතේ නමත්, ඒ කාර්යය සඳහා තබා තිබෙන ලේඛනයෙහි ඇතුළත් කළ යුතු අතර, ඒ පොත එවකට ලබාගෙන සිටි සාමාජිකයා එය ආපසු ගෙනවිත් භාර දුන් විට පුස්තකාලයාධිපති විසින් ලේඛනයෙහි නම ඇතුළත් කළ සාමාජිකයාට එය නිකුත් කළ යුතුය. යම් පොතක් සඳහා සාමාජිකයන් දෙදෙනෙකු හෝ ඊට වැඩි ගණනක් ලේඛනයෙහි නම් ඇතුළත් කර ඇති විට ලේඛනයෙහි ඒ නම් ඇතුළත් කර තිබෙන අනු පිළිවෙලට ඔවුන්ට ඒ පොත නිකුත් කළ යුතුය.

22. යම් සාමාජිකයෙකු සභාවේ පාලන සීමා තුළ පදිංචිව සිටීම හෝ කාර්යාලයක් හෝ ව්‍යාපාරික ස්ථානයක් එහි පවත්වා ගෙන යෑම නතර කළ විට, පොත් පත් බැහැරට දෙන පුස්තකාලයේ ඔහුගේ සාමාජිකත්වය කෙළවර විය යුතු අතර, 8 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ඔහුට නිකුත් කරන ලද අවසර පත්‍ර දෙක ඔහු විසින් පුස්තකාලයාධිපතිට ආපසු භාරදිය යුතුය.

23. 7 (1) (ඇ) වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ යම් තැනැත්තෙකු විසින් ගෙවා ඇති රුපියල් පහේ තැන්පත් මුදල, පොත්පත් බැහැරට දෙන පුස්තකාලයට ඔහුගෙන් අය විය යුතු යම් මුදලක් වේතොත් එය අඩු කර ගෙන, ඒ තැනැත්තාගේ සාමාජිකත්වය කෙළවර වීමේදී ඔහුට ආපසු ගෙවිය යුතුය.

24. පොත් පත් බැහැරට දෙන පුස්තකාලය, ඉරිදා දිනවල සහ රජයේ නිවාඩු දින වලත්, පොත ගණන් බැලීම සඳහා කාරක සභාව විසින් යටත් පිරිසෙයින් දින හතක්වත් දැන්වීමක් දෙනු ලැබ මෙන් පසුව නියම කර ගනු ලබන වෙනත් යම් දිනවලත් හැර, දිනපතා පෙරවරු 9 සිට පස්වරු 5.30 දක්වා වූ කාලය තුළ විවෘත කර තැබිය යුතුය.

### ආශ්‍රය පුස්තකාලය

25. කිසිම තැනැත්තකු—

(අ) ඒ සඳහා පුස්තකාලයාධිපතිගෙන් අවසර ලබාගෙන ඇති නම්, සහ

(ආ) ආශ්‍රය පුස්තකාලයෙහි තබා තිබෙන ලේඛණය අත්සන් කර ඇති නම් මිස

තමා විසින් ආශ්‍රය පුස්තකාලයෙන් ප්‍රයෝජනය නොගත යුතුය.

26. පුස්තකාලයාධිපති විසින් —

(අ) අකුරු කියවීමට දන්නාවූ,

(ආ) සභාවේ පාලන සීමා තුළ පදිංචිකරුවෙකු වූ, සහ

(ඇ) වයස අවුරුදු දහහතරකට අඩු නොවූ,

යම් තැනැත්තෙකුට ආශ්‍රය පුස්තකාලයෙන් ප්‍රයෝජන ගැනීමට අවසර දිය හැකිය.

27. කිසිම තැනැත්තෙකු විසින් ආශ්‍රය පුස්තකාලයෙහි දී බැලීම සඳහා තමා වෙත නිකුත් කරණු ලැබූ කිසිම පොතක් ආශ්‍රය පුස්තකාලයෙන් බැහැරට ගෙන නොයා යුතුය.

28. (1) මේ අතුරු ව්‍යවස්ථාවේ (2) වැනි ඡේදයේ විධි විධාන වලට යටත්ව ආශ්‍රය පුස්තකාලය, පොහෝ දිනයක හෝ රජයේ නිවාඩු දිනයක හැර වෙනත් ඕනෑම දිනයක පෙරවරු 8 ටත් පස්වරු 5.30 ටත් අතර කාලය තුළ විවෘතව තැබිය යුතුය.

(2) සභාව විසින්—

(අ) මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වැනි ඡේදයෙහි නිශ්චිතව සඳහන් කාලවේලාවල් දීර්ඝ කිරීම,

(ආ) බඩු ගණන් ගැනීම සඳහා සභාව විසින් නියම කළ හැකි යම් යම් දිනවල ආශ්‍රය පුස්තකාලය වසා තැබීමට කාරක සභාවට නියම කිරීම

යෝජනා සම්මුතියෙන් කළ හැකිය.

### කියවීම් ශාලාව

29. කිසිම තැනැත්තකු—

(අ) ඒ සඳහා පුස්තකාලයාධිපති ගෙන් අවසරය ලබා ඇතොත් සහ

(ආ) කියවීම් ශාලාවේ තබා තිබෙන ලේඛණය අත්සන් කර ඇත හොත් මිස

තමා විසින් කියවීම් ශාලාව පාවිච්චි නොකළ යුතුය.

30. (අ) අකුරු කියවීමට දන්නා.

(ආ) සභාවේ පාලන සීමා තුළ පදිංචිව සිටින සහ

(ඇ) වයස අවුරුදු දහහතරකට අඩු නොවූ යම් තැනැත්තකුට පුස්තකාලය පාවිච්චි කිරීමට පුස්තකාලයාධිපති විසින් අවසර දිය හැකිය.

31. (1) මේ අතුරු ව්‍යවස්ථාවේ (2) වැනි ඡේදයේ විධිවිධාන වලට යටත්ව, පොහොය දිනයක් හෝ රජයේ නිවාඩු දිනයක් නොවන සතියේ කවර දිනක වුවත් පෙරවරු 8 සිට දහවල් 11.30 දක්වාවූ කාලය තුළ සහ පස්වරු 1 සිට පස්වරු 5.30 දක්වා වූ කාලය තුළ කියවීම් ශාලාව විවෘත කර තැබිය යුතුය.

(2) සභාව විසින් —

(අ) මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වැනි ඡේදයෙහි නිශ්චිතව සඳහන් කාලය දීර්ඝ කිරීම,

(ආ) යෝජනාවේ නිශ්චිතව සඳහන් කළ හැකි පරිදි පොහොය දිනයක හෝ රජයේ නිවාඩු දිනයක යම් යම් කාලවේලාවලදී කියවීම් ශාලාව විවෘත කර තබන ලෙස කාරක සභාවෙන් ඉල්ලා සිටීම, හෝ

(ඇ) බඩු ගණන් බැලීම සඳහා සභාව විසින් නියම කරනු ලබන දිනවලදී කියවීම් ශාලාව වසා තබන මෙන් කාරක සභාවට නියම කිරීම

යෝජනා සම්මුතියෙන් කළ හැකිය.

**32.** කියවීම් ශාලාවේ තබා තිබෙන හෝ ඊට අයිති යම් ප්‍රවෘත්ති පත්‍රයක්, වාර සංග්‍රහයක්, සඟරාවක්, සිතියමක්, ලේඛණයක්, අත් පිටපතක් හෝ වෙන යම් දෙයක් කිසිම තැනැත්තෙකු විසින් කියවීම් ශාලාවෙන් පිටතට ගෙන නොයා යුතුය.

**33.** යෝජනාවක් මගින් යෝජනාවේ සඳහන් යම් යම් නිශ්චිත කාල සීමාවන් තුළ පොහොය දිනක හෝ රජයේ නිවාඩු දිනයක ආශ්‍රය පුස්තකාලය, බැහැරට දෙන පුස්තකාලය සහ කියවීම් ශාලාව විවෘත කර තැබීමට සභාව විසින් කාරක සභාවට නියම කළ හැකිය.

සාමාන්‍ය කරුණු

**34.** බෝවෙන රෝගයකින්, ස්පර්ශයෙන් බෝවෙන රෝගයකින් හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතකදී පෙළෙමින් සිටි හෝ එවැනි රෝගයකින් පෙළුණු යම් කෙනෙකුට මෑතකදී සාත්තු කරමින් සිටි කිසිම තැනැත්තකු විසින් ඒ රෝග බීජ මැරීමට හා රෝගය බෝවීමට ගතවන කාල සීමාව පසුවන තෙක් මහජන පුස්තකාලයට අයත් ස්ථානයට ඇතුළු නොවිය යුතුය.

**35.** කිසිම තැනැත්තකු විසින් —

(1) මහජන පුස්තකාලයට අයිති ස්ථානය ඇතුළත හෝ ඒ අසල අනිසි ලෙස හැසිරීම හෝ පීඩාවක් ඇති වන කිසිම දෙයක් කිරීම,

(2) සභා ගොඩනැගිල්ලේ කිසිම කොටසක හෝ මහජන පුස්තකාලය තුළ හෝ ඒ අසළ වූ සභාවට අයත් කිසිම දේපලකට හානියක් කිරීම හෝ එය මොනම අන්දමකින් වත් විරූපි කිරීම,

(3) තමා ගැන සතුටුදායක විස්තරයක් කිරීමට නොහැකිව මහජන පුස්තකාලය වැසීමෙන් පසු ඒ පුස්තකාලයට අයිති ස්ථානයෙහි රැඳී සිටීම හෝ නිකරුනේ ගැවසීම,

(4) මහජන පුස්තකාලයට අයත් ස්ථානය ඇතුළත දුම්බීම හෝ කෙළ ගැසීම,

(5) මහජන පුස්තකාලයට අයත් ස්ථානය ඇතුළතදී දාදු කෙළීම හෝ කඩදාසි කුට්ටමෙන් සූදු කෙළීම හෝ අන් කිසි ක්‍රීඩාවක් කිරීම,

(6) පුස්තකාලය ඇතුළත දී කෑගැසීමෙන් හෝ ගී සින්දු කීමෙන් හෝ වෙනයම් ඝෝෂාවක් කිරීමෙන් මහජන පුස්තකාලය පාවිච්චි කරන්නන්ට කරදර කිරීම,

(7) අපිරිසිදු තත්ත්වයකින් මහජන පුස්තකාලයට අයිති ස්ථානයට ඇතුළුවීම,

(8) මහජන පුස්තකාලයට අයත් ස්ථානය තුළට යම් බල්ලකු හෝ වෙනයම් සතෙකු ගෙන ඒම,

(9) මහජන පුස්තකාලයට අයත් ස්ථානයේ යම් කොටසක නිදා ගැනීම හෝ යම් කිසි ආහාරයක් ගැනීම,

(10) මේ අතුරු ව්‍යවස්ථා යටතේ තමා වෙත පැවරී ඇති බලතල නීත්‍යානුකූලව පාවිච්චි කිරීමෙහිදී පුස්තකාලයාධිපතිට හෝ ඔහුගේ අණ පරිදි ක්‍රියා කරන යම් තැනැත්තෙකුට අවහිර කිරීම,

නොකළ යුතුය.

3–719—73.03.02 දින අංක 49 දරණ ගැසට් පත්‍රය

---

තිරගන්දහය (බටහිර) ගම්සභාව-බෝයගනේ

අතුරු ව්‍යවස්ථා

මෙම අතුරු ව්‍යවස්ථා තිරගන්දහය (බටහිර) ගම්සභාවේ මධ්‍ය පුස්තකාල අතුරු ව්‍යවස්ථා නමින් හැඳින් වේ.

**1.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය නොවුවහොත්. මේ අතුරු ව්‍යවස්ථාවල "පුස්තකාලයාධිපති." යන්නෙන් පුස්තකාලය භාරව සිටීම පිණිස සභාව විසින් පත් කරනු ලබන තැනැත්තා අදහස් වන අතර, ඔහුගේ සහකරුවෝද එයට ඇතුළත් වෙති.

**2.** තිරගන්දහය (බටහිර) ගම්සභාව මගින් පාලනය කරනු ලබන පුස්තකාලය පහත සඳහන් අංශයන්ගෙන් සමන්විත වේ :—

(අ) පොත් පත් බැහැරට දෙන පුස්තකාලයකින් ;

(ආ) ආශ්‍රය පුස්තකාලයකින් ;

(ඇ) කියවීම් ශාලාවකින් ; සහ

(ඈ) පහත දැක්වෙන දෑ, එනම් :—

(i) පුස්තකාලයේ ළමා අංශයක් ;

(ii) ප්‍රජාමණ්ඩලවලට සහ ඒ හා සමාන අනුමත ප්‍රජා ව්‍යාපාරවලට තාවකාලික පාවිච්චියට පොත් දීම ; සහ

(iii) පළාත් පාලන කොමසාරිස් වරයාගේ පූර්ව අනුමැතිය ඇතිව සභාව විසින් අනුමත කරන ලද වෙනත් යම් පුස්තකාල සේවයක්

යන මේවා අතුරින් කවරකින් හෝ සමන්විත වන ව්‍යාප්ත පුස්තකාල සේවයකින් සමන්විත විය හැකිය.

(3) (i) මහජන පුස්තකාලයේ පරිපාලනය හා සාමාන්‍ය පාලනය (මින්පසු මෙහි "කාරක සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන)

(අ) සභාවේ එවකට සිටින සභාපතියෙන් ;

(ආ) සභාව විසින් තෝරා පත් කරනු ලබන හතර දෙනෙකුට වැඩි නොවූ සභාවේ වෙනත් සාමාජිකයන් ගණනකින් ; සහ

(ඇ) සභාව විසින් තෝරා ගනු ලබන සභාවේ පාලන සීමාව ඇතුළත පදිංචි ප්‍රසිද්ධ තැනැත්තන් පස් දෙනෙකුගෙන්ද ;

යුක්ත වූ පුස්තකාල කාරක සභාවක් වෙත පැවරිය යුතුය.

(ii) පුස්තකාලය භාරව සිටිය යුතු පුස්තකාලයාධිපතියෙකු සභාව විසින් පත් කළ හැකි අතර ඒ පුස්තකාලය ඇතුළත මනා විනය පවත්වාගෙන යාම ගැන ඔහු වගකිව යුතුය.

(4) (i) සභාවේ සභාපති නිල බලයෙන් කාරක සභාවේ සභාපති විය යුතු අතර, කාරක සභාවේ සෑම රැස්වීමකම මූලසුන ඔහු විසින් ඇරිය යුතුය. කාරක සභාවේ යම් රැස්වීමකට සභාපති නොපැමිණි අවස්ථාවක, පැමිණ සිටින සෙසු සාමාජිකයින් විසින් ඒ කාර්යය සඳහා තෝරා ගනු ලබන සාමාජිකයෙකු ඒ රැස්වීමේ මූලසුන ඇරිය යුතුය.

(ii) යම් රැස්වීමක මූලසුන දරණ සාමාජිකයාට මුල් ඡන්දයක් ද, යම් ප්‍රශ්නයක් සම්බන්ධයෙන් දෙන ලද ඡන්ද සංඛ්‍යාව සමාන වුවහොත්, තීරක ඡන්දයක් ද හිමි විය යුතුය.

**5.** සාමාජිකයින් පස් දෙනෙකුගේ ගණපූරණයක් නොමැති වුවහොත් කාරක සභාවේ යම් රැස්වීමකදී කිසිම කටයුත්තක් නොකළ යුතුය.

**6.** (i) අවශ්‍යයයි කාරක සභාව විසින් සලකනු ලබන යම් යම් කොන්දේසිවලට යටත් කොට මහජන පුස්තකාලයට අයත් ස්ථානයේ යම් කොටසක් පාවිච්චි කිරීම පිණිස කවර තැනැත්තෙකුට වුවද අවසර දීමට හෝ පුස්තකාල පිළිබඳ මේ අතුරු ව්‍යවස්ථාවන්ගෙන් යම් කිසිවක් කඩ කර ඇති කවර තැනැත්තෙකුට හෝ ඒ ස්ථානයේ කවර කොටසක් වුවද පාවිච්චි කිරීමට අවසර දීම ප්‍රතික්ෂේප කිරීමට කාරක සභාවට බලය තිබිය යුතුය.

(ii) දින දෙකක කල් දීමක් ඇතිව සභාපති විසින් කවර හෝ අවස්ථාවක කැඳවනු ලබන රැස්වීම්වලට පුස්තකාල කාරක සභාව රැස් විය යුතුය. එබඳු රැස්වීමක් කැඳවීමක් නොමැති අවස්ථාවල යටත් පිරිසෙයින් මාස දෙකකට වරක්වත් එසේ රැස් විය යුතුය. එබඳු රැස්වීම්වල ලේකම් වශයෙන් පුස්තකාලයාධිපති කටයුතු කළ යුතුය.

පොත්පත් බැහැරට දෙන පුස්තකාලය

**7.** (i) කිසිම තැනැත්තෙකු :—

(අ) වයස අවුරුදු 14 ට නොඅඩු වුවහොත් ;

(ආ) අකුරු කියවීමට දනිතහොත් ;

(ඇ) සභාවේ පාලන සීමාව තුළ පදිංචිව සිටියහොත් හෝ තමාගේ කාර්යාලයක් හෝ ව්‍යාපාරික ස්ථානයක් එම සීමා තුළ තිබෙතහොත් ;

(ඈ) රුපියල් පහක (5) මුදලක් පුස්තකාලයාධිපති වෙත තැන්පත් කරතහොත් ; සහ,

(ඉ) රුපියල් විසිපහකට (25) නොඅඩු මාසික කුලියක් ලැබෙන සභාවේ පාලන සීමාව තුළ පිහිටි ගෙයක ප්‍රධාන පදිංචිකරුවෙකු හෝ අයිතිකරුවෙකු විසින් නිර්දේශ කරනු ලබත හොත්,

මිස පොත්පත් බැහැරට දෙන පුස්තකාලයේ සාමාජිකයෙකු වශයෙන් ඔහු ඇතුළත් කර නොගත යුතුය.

(ii) පොත් පත් බැහැරට දෙන පුස්තකාලයේ සාමාජිකයෙකු වශයෙන් ඇතුළත්වීමට අදහස් කරන සෑම තැනැත්තෙකු විසින් ඒ සඳහා පුස්තකාලයාධිපතිගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රයක ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ යුතු අතර, එකී ඉල්ලුම් පත්‍රය පහත සඳහන් යම් තැනැත්තෙකු විසින් අනුමත කිරීම වශයෙන් පිටසන් කර තිබිය යුතුය.

(අ) රාජ්‍ය සභා නියෝජිතවරයෙකු ;

(ආ) සභාවේ සාමාජිකයෙක්,

(ඇ) පුස්තකාල කාරක සභාවේ සාමාජිකයෙකු,

(ඈ) ආගමික පූජකවරයෙක්,

(ඉ) වෛද්‍ය හෝ නීතිඥ වෘත්තියෙහි සාමාජිකයෙක්,

(ඊ) සාමදාන විනිශ්චයකාරුවෙක්,

(එ) රු. 1,500 කට නොඅඩු වාර්ෂික වැටුපක් ලබන රජයේ සේවකයෙක්,

(ඒ) ද්විතියන පාසැලක විදුහල්පතිවරයෙක් හෝ,

(ඔ) රුපියල් 1,500 කට නොඅඩු වාර්ෂික වැටුපක් ලබන සභාවේ සේවකයෙක්.

(iii) ඉහත සඳහන් ඡේදය යටතේ ඉල්ලුම් පත්‍රයක් පිටසන් කිරීමට අයිතිවාසිකමක් ඇති යම්කිසි තැනැත්තෙකුට ඔහුගේ ඉල්ලුම් පත්‍රය පිටසන් කරවා ගැනීමට අවශ්‍ය නොවිය යුතුය.

8. පොත් පත් බැහැරට දෙන පුස්තකාලයේ සාමාජිකයෙකු වශයෙන් ඇතුළත් කර ගනු ලැබූ සෑම තැනැත්තකුම පුස්තකාලයාධිපති විසින් අවසර පත්‍ර දෙකක් දිය යුතු අතර ඒ තැනැත්තා ඒ එක් එක් අවසර පත්‍රය පිට පොතක් ලබාගෙන බැහැරට ගෙන යාමට හිමිකම් තිබිය යුතුය.

9. පොත්පත් බැහැරට දෙන පුස්තකාලයේ සාමාජිකයෙකු තමාට ලැබී තිබෙන අවසර පත්‍රයක් පිට ඒ පුස්තකාලයෙන් බැහැරට ගෙන යන කවර පොතක් ගැන වුවද, වගකිව යුතුය.

10. පොත්පත් බැහැරට දෙන පුස්තකාලයේ සාමාජිකයෙකුට 8 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ දෙන ලද අවසර පත්‍රයක් නැති වූ විට ඒ සාමාජිකයා විසින් වහාම ඒ බව පුස්තකාලයාධිපතිට දැන්විය යුතුය. පොත්පත් බැහැරට දෙන පුස්තකාලයෙන් ඒ අවසර පත්‍රය පිට පොතක් ගෙන ගොස් නැතිවූ බව පුස්තකාලයාධිපති සෑහීමකට පත් වුවහොත්, ඔහු විසින් ඒ සාමාජිකයාට ඒ අවසර පත්‍රයේ දෙවෙනි පිටපතක් නිකුත් කළ හැකිය. එහෙත් ඒ අවසර පත්‍රය නැති වූ බව තමාට දැනුම් දෙන ලද දිනයේ සිට යටත් පිරිසෙයින් තිස් දිනක් ඉකුත් වී ඇතොත් මිස එබඳු දෙවෙනි පිටපතක් පුස්තකාලයාධිපති විසින් නිකුත් නොකළ යුතුය.

11. පොත්පත් බැහැරට දෙන පුස්තකාලයෙන් සාමාජිකයෙකු විසින් ලබා ගන්නා ලද යම් පොතක් එය ලබාගත් දින සිට දින දහහතරක් ඇතුළතදී පුස්තකාලයාධිපතිට ආපසු භාර දිය යුතුය. ඒ පොත අන්‍ය සාමාජිකයෙකුට අවශ්‍ය නොවුවහොත්, තවත් දවස් දහ හතරක කාල සීමාවකට එය ලබා ගැනීමට පුස්තකාලයාධිපති විසින් එ සාමාජිකයාට ඉඩ දිය හැකිය.

12. 11 වෙනි අතුරු ව්‍යවස්ථාවේ නිශ්චිතව සඳහන් දින දහ හතරේ කාලසීමාව ඇතුළත යම් පොතක් පුස්තකාලයාධිපතිට ආපසු භාරදීමට සාමාජිකයෙකු අපොහොසත් වූ විට, පොත භාරදීම ප්‍රමාද වන එක් එක් දවසකට ශත දහය බැගින් වූ දඩ මුදලක් ගෙවීමට ඔහු බැඳී සිටිය යුතුය

13. පොත්පත් බැහැරට දෙන පුස්තකාලයෙන් ලබාගන්නා ලද යම් පොතක් 11 වෙනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් දින දහහතරේ කාලසීමාව ඉකුත් වී තිස් දවසක් ඇතුළත ආපසු භාරදීමට සාමාජිකයෙකු අපොහොසත් වූ විට, ඒ පොත නැති වූවා සේ සැලකිය යුතුය.

14. සාමාජිකයෙකු විසින් ලබා ගන්නා ලද පොතක් නැති වූ විට හෝ නැති වූවාසේ සලකනු ලබන විට, ඒ වෙනුවට අළුතින් පොතක් ගැනීම සඳහා යන වියදම් ඒ සාමාජිකයා විසින් ගෙවිය යුතුය.

15. පොත්පත් බැහැරට දෙනු ලබන පුස්තකාලයෙන් ලබා ගන්නා ලද කිසිම පොතකට කිසිම සාමාජිකයෙකු විසින් කිසිම අන්දමක හානියක් හෝ අලාභයක් නොකළ යුතුය.

16. පොත්පත් බැහැරට දෙන පුස්තකාලයෙන් ලබා ගැනීමට තමා අදහස් කරන යම් පොතකට යම් හානියක් හෝ අලාභයක් සිදු වී ඇතහොත් ඒ බව පුස්තකාලයාධිපතිට දැනුම් දීම සෑම සාමාජිකයෙකුගේම යුතුකම විය යුතුය. එවැනි යම් හානියක් හෝ අලාභයක් පුස්තකාලයාධිපතිට දැන්වීම ඔහු විසින් පැහැර හරිනු ලැබූ විට, ඒ පොත යම් අලාභයක් හෝ හානියක් සිදු වී නැති හොඳ තත්ත්වයෙන් ඔහුට නිකුත් කරන ලද්දේ යයි සැලකිය යුතුය.

17. සාමාජිකයෙකු විසින් ආපසු ගෙනවිත් භාරදුන් පොතකට, එය තවදුරටත් නිකුත් කිරීමට නුසුදුසු වන තරමට ඒ සාමාජිකයා විසින් හානිකර තිබේයයි පුස්තකාලයාධිපති සෑහීමට පත් වූ විට, ඒ පොත වෙනුවෙන් අළුත් පොතක් ගැනීම පිණිස වියදම් ගෙවීමට ඒ සාමාජිකයා බැඳී සිටිය යුතුය. ඒ පොත වෙනුවට ඒම පොතේ අළුත් පිටපතක් යෙදූ විට "මහජන පුස්තකාලය—හානිවූ පොතක් වශයෙන් විකුණන ලදී" යන වචන සහිත මුද්‍රාව තබා හානියට පත් වූ පොත ඒ සාමාජිකයාට දිය යුතුය.

18. (i) පොත්පත් බැහැරට දෙන පුස්තකාලයෙන් ලබාගත් කිසිම පොතක් කිසිම සාමාජිකයෙකු විසින් අන් තැනැත්තෙකුට නොදිය යුතුය.

(ii) මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වැනි ඡේදයේ විධිවිධාන කඩ කරන යම් සාමාජිකයෙකුගේ තැන්පත් මුදල ඔහුට අහිමි විය යුතු අතර, බැහැරට දෙන පුස්තකාලයේ ඔහුගේ සාමාජිකත්වයද කෙළවර විය යුතුය.

19. (i) යම් බෝවෙන රෝගයකින්, ස්පර්ශයෙන් බෝවෙන රෝගයකින් හෝ චර්ම රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකු විසින් පාවිච්චි කරන ලදැයි තමා දන්නා කිසිම පොතක් කිසිම සාමාජිකයෙකු විසින් පොත්පත් බැහැරට දෙන පුස්තකාලයට ආපසු භාර නොදිය යුතුය.

(ii) පොත්පත් බැහැරට දෙන පුස්තකාලයෙන් සාමාජිකයෙකු විසින් ලබාගන්නා ලද පොතක් බෝවෙන රෝගයකින්, ස්පර්ශයෙන් බෝවෙන රෝගයකින් හෝ චර්ම රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකු විසින් පාවිච්චි කර ඇති විට, ඒ පොත විනාශ කර දැමිය යුතු අතර, ඒ පොත වෙනුවෙන් අළුත් පොතක් ගැනීම සඳහා යන වියදම ඒ සාමාජිකයා විසින් පුස්තකාලයාධිපතිට ගෙවිය යුතුය.

20. යම්කිසි එක පොතක් කවර සාමාජිකයෙකුට ලැබිය යුතුද යන්න පිළිබඳව පුස්තකාලයේදී සාමාජිකයින් දෙදෙනකු හෝ ඊට වැඩි දෙනෙකු අතර යම් ආරාවුලක් ඇති වූ විට, පුස්තකාලයාධිපති විසින් ඒ ආරාවුල විසඳිය යුතුවාක් මෙන්මැ ඒ පිළිබඳව ඔහුගේ නිගමනය අවසන් හා තීරනාත්මක විය යුතුය.

21. වෙන සාමාජිකයෙකු විසින් ලබාගෙන ඇති පොතක් ඔහුගෙන් පසු ලබා ගැනීමට අදහස් කරන කවර සාමාජිකයෙකු වුවද, තමාගේ නම සහ ඒ පොතේ නමත්, ඒ කාර්යය සඳහා තබා තිබෙන ලේඛන යෙහි ඇතුළත් කළ යුතු අතර, ඒ පොත එවකට ලබාගෙන සිටි සාමාජිකයා එය ආපසු ගෙනැවිත් භාරදුන් විට පුස්තකාලයාධිපති විසින් ලේඛණයෙහි නම ඇතුළත් කළ සාමාජිකයාට එය නිකුත් කළ යුතුය. යම් පොතක් සඳහා සාමාජිකයන් දෙදෙනෙක් හෝ ඊට වැඩි ගණනක් ලේඛණයෙහි නම ඇතුළත් කර ඇති විට, ලේඛණ යෙහි ඒ නම් ඇතුළත් කර තිබෙන අනුපිළිවෙළට ඔවුන්ට ඒ පොත නිකුත් කළ යුතුය.

22. මිය සාමාජිකයෙකු සභාවේ පාලන සීමාව තුළ පදිංචිව සිටීම හෝ කාර්යාලයක් හෝ ව්‍යාපාරික ස්ථානයක් එහි පවත්වාගෙන යාම නතර කළ විට, පොත්පත් බැහැරට දෙන පුස්තකාලයේ ඔහුගේ සාමාජිකත්වය කෙළවර විය යුතු අතර, 8 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ඔහුට නිකුත් කරන ලද අවසර පත්‍ර දෙක ඔහු විසින් පුස්තකාලයාධිපතිට ආපසු භාර දිය යුතුය.

23. (7) (1) වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ යම් තැනැත්තෙකු විසින් ගෙවා ඇති රුපියල් පහේ තැන්පත් මුදල, පොත්පත් බැහැරට දෙන පුස්තකාලයට ඔහුගෙන් අයවිය යුතු යම් මුදලක් වෙතොත් එය අඩුකර ගෙන, ඒ තැනැත්තාගේ සාමාජිකත්වය කෙළවර වීමේදී ඔහුට ආපසු ගෙවිය යුතුය.

24. පොත්පත් බැහැරට දෙන පුස්තකාලය, ඉරිදා දිනවල සහ රජයේ නිවාඩු දිනවලත්, තොග ගණන් බැලීම සඳහා කාරක සභාව විසින් යටත් පිරිසෙයින් දින හතක්වත් දැන්වීමක් දෙනු ලැබී මෙන් පසුව නියම කර ගනු ලබන වෙනත් යම් දිනවලත් හැර දිනපතා පෙරවරු 8 සිට පස්වරු 3.30 දක්වා වූ කාලය තුළ විවෘත කර තැබිය යුතුය.

### ආශ්‍රය පුස්තකාලය

25. කිසිම තැනැත්තෙකු—

(අ) ඒ සඳහා පුස්තකාලයාධිපතිගෙන් අවසර ලබාගෙන ඇති නම්; සහ

(ආ) ආශ්‍රය පුස්තකාලයෙහි තබා තිබෙන ලේඛණය අත්සන් කර ඇති නම් මිස තමා විසින් ආශ්‍රය පුස්තකාලයෙන් ප්‍රයෝජනය නොගත යුතුය.

26. පුස්තකාලයාධිපති විසින්—

(අ) අකුරු කියවීමට දන්නා වූ,

(ආ) සභාවේ පාලන සීමාව තුළ පදිංචිකරුවෙකු වූ; සහ

(ඇ) වයස අවුරුදු දහහතරකට අඩු නොවූ;

යම් තැනැත්තෙකුට ආශ්‍රය පුස්තකාලයෙන් ප්‍රයෝජනය ගැනීමට අවසර දිය හැකිය.

27. කිසිම තැනැත්තෙකු විසින් ආශ්‍රය පුස්තකාලයෙහිදී බැලීම සඳහා තමා වෙත නිකුත් කරනු ලැබූ කිසිම පොතක් ආශ්‍රය පුස්තකාලයෙන් බැහැරට ගෙන නොයා යුතුය.

28. (i) මේ අතුරු ව්‍යවස්ථාවේ (2) වැනි ඡේදයේ විධිවිධානවලට යටත් ආශ්‍රය පුස්තකාලය පොහෝ දිනයක හෝ රජයේ නිවාඩු දිනයට හැර වෙනත් ඕනෑම දිනයක පෙරවරු 8 ටත් පස්වරු 6.30 ටත් අතර කාලය තුළ විවෘතව තැබිය යුතුය.

(ii) සභාව විසින් :—

(අ) මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වෙනි ඡේදයේ නිශ්චිතව සඳහන් කාලවේලාවල් දීර්ඝ කිරීම,

(ආ) බඩු ගණන් ගැනීම සඳහා සභාව විසින් නියම කළ හැකි යම් දිනවල ආශ්‍රය පුස්තකාලය වසා තැබීමට කාරක සභාවට නියම කිරීම යෝජනා සම්මුතියෙන් කළ හැකිය.

### කියවීම් ශාලාව

29. කිසිම තැනැත්තෙකු :—

(අ) ඒ සඳහා පුස්තකාලයාධිපතිගෙන් අවසරය ලබා ඇතොත් සහ

(ආ) කියවීම් ශාලාවේ තබා තිබෙන ලේඛණය අත්සන් කර ඇතහොත් මිස තමා විසින් කියවීම් ශාලාව පාවිච්චි නො කළ යුතුය.

30. (අ) අකුරු කියවීමට දන්නා,

(ආ) සභාවේ පාලන සීමාව තුළ පදිංචිව සිටින, සහ

(ඇ) වයස අවුරුදු දහහතරකට අඩු නොවූ යම් තැනැත්තෙකුට පුස්තකාලය පාවිච්චි කිරීමට පුස්තකාලයාධිපති විසින් අවසර දිය හැකිය.

31. (I) මේ අතුරු ව්‍යවස්ථාවේ (II) වැනි ඡේදයේ විධිවිධාන වලට යටත්ව, පොහෝ දිනයක් හෝ රජයේ නිවාඩු දිනයක් නොවන සතියේ කවර දිනයක වුවත් පෙරවරු 8.00 සිට දහවල් 12.00 දක්වා වූ කාලය තුළ කියවීම් ශාලාව විවෘතව තැබිය යුතුය.

(II) සභාව විසින්—

(අ) මේ අතුරු ව්‍යවස්ථාවේ (I) වැ නිඡේදයේ නිශ්චිතව සඳහන් කාලය දීර්ඝ කිරීම,

(ආ) යෝජනාවේ නිශ්චිතව සඳහන් කළ හැකි පරිදි පොහොය දිනයක හෝ රජයේ නිවාඩු දිනයක යම් යම් කාලවේලා වලදී කියවීම් ශාලාව විවෘත කර තබන ලෙස කාරක සභාවෙන් ඉල්ලා සිටීම, හෝ

(ඇ) බඩු බඩු ගණන් බැලීම සඳහා සභාව විසින් නියම කරනු ලබන දිනවලදී කියවීම් ශාලාව වසා තබන මෙන් කාරක සභාවට නියම කිරීම යෝජනා සම්මුතියෙන් කළ හැකිය.

32. කියවීම් ශාලාවේ තබා තිබෙන හෝ ඊට අයිති යම් ප්‍රවෘත්ති පත්‍රයක්, වාර සංග්‍රහයක්, සඟරාවක්, සිතියමක්, ලේඛණයක්, අත් පිටපතක් හෝ වෙනයම් දෙයක් කිසිම තැනැත්තෙකු විසින් කියවීම් ශාලාවෙන් පිටතට ගෙන නොයා යුතුය.

33. යෝජනාවක් මගින් යෝජනාවේ සඳහන් යම් යම් නිශ්චිත කාල සීමාවක් තුළ පොහොය දිනයක හෝ රජයේ නිවාඩු දිනයක ආශ්‍රය පුස්තකාලය, බැහැරට දෙන පුස්තකාලය සහ කියවීම් ශාලාව විවෘත කර තැබීමට සභාව විසින් කාරක සභාවට නියම කළ හැකිය.

### සාමාන්‍ය කරුණු

34. බෝවෙන රෝගයකින්, ස්පර්ශයෙන් බෝවෙන රෝගයකින්, හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතකදී පෙළෙමින් සිටි හෝ, එවැනි රෝගයකින් පෙළුණු යම් කෙනෙකුට මෑතකදී සාත්තු කර මින් සිටි කිසිම තැනැත්තෙකු විසින් ඒ රෝග බීජ මැරීමට හා රෝගය බෝවීමට ගතවන කාල සීමාව පසුවන තෙක් මහජන පුස්තකාලයට අයත් ස්ථානයකට ඇතුළු නොවිය යුතුය.

35. කිසිම තැනැත්තෙකු විසින්—

(i) මහජන පුස්තකාලයට අයිති ස්ථානය ඇතුළත හෝ ඒ අසල අනිසි ලෙස හැසිරීම හෝ පීඩාවක් ඇතිවන කිසිම දෙයක් කිරීම ;

(ii) සභා ගොඩනැගිල්ලේ කිසිම කොටසකට හෝ මහජන පුස්තකාලය තුළ හෝ ඒ අසල වූ සභාවට අයත් කිසිම දේපොළකට හානියක් කිරීම හෝ එය මොනම අන්දමකින් වත් විරූපී කිරීම ;

(iii) තමා ගැන සතුටුදායක විස්තරයක් කිරීමට නොහැකිව මහජන පුස්තකාලය වැසීමෙන් පසු ඒ පුස්තකාලයට අයිති ස්ථානයෙහි රැඳී සිටීම හෝ නිකරුනේ ගැවසීම ;

(iv) මහජන පුස්තකාලයට අයත් ස්ථානය ඇතුළත දුම්බීම හෝ කෙළ ගැසීම ;

(v) මහජන පුස්තකාලයට අයත් ස්ථානය ඇතුළතදී ඔට්ටු කෙළීම, හෝ කඩදාසි කුට්ටමෙන් සූදු කෙළීම හෝ අන් කිසි ක්‍රීඩාවක් කිරීම ;

(vi) පුස්තකාලය ඇතුළතදී කෑගැසීමෙන් හෝ ගී, සින්දු කීමෙන් හෝ වෙනයම් ඝෝෂාවක් කිරීමෙන් මහජන පුස්තකාලය පාවිච්චි කරන්නන්ට කරදර කිරීම ;

(vii) අපිරිසිදු තත්වයකින් මහජන පුස්තකාලයට අයිති ස්ථානයට ඇතුළුවීම ;

(viii) මහජන පුස්තකාලයට අයත් ස්ථානය තුලට යම් බල්ලෙකු හෝ වෙනයම් සතෙකු ගෙන ඒම ;

(ix) මහජන පුස්තකාලයට අයත් ස්ථානයේ යම් කොටසක නිදා ගැනීම හෝ යම්කිසි ආහාරයක් ගැනීම ;

(x) මේ අතුරු ව්‍යවස්ථා යටතේ තමා වෙත පැවරී ඇති බලතල නීත්‍යානුකූලව පාවිච්චි කිරීමෙහිදී පුස්තකාලයාධිපතිට හෝ ඔහුගේ අණ පරිදි ක්‍රියා කරන යම් තැනැත්තෙකුට අවහිර කිරීම ,

නොකළ යුතුය.

36. මෙම අතුරු ව්‍යවස්ථාවල—

"සභාපතිතුමා" යනුවෙන් ගම්සභාවේ සභාපති තුමාද,

"ගම්සභාව" යනුවෙන් තිරගන්දහය (බටහිර) ගම්සභාවටද,

"ගම්සභා ප්‍රදේශය" යනුවෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ තිරගන් දහය (බටහිර) ගම්සභා ප්‍රදේශද,

"පුස්තකාලයාධිපති" යනුවෙන්, තිරගන්දහය (බටහිර) ගම්සභාව මගින් පත්කර ඇති අයද,

"සාමාජිකයා" යනුවෙන් 7 (1) වන රීතිය යටතේ සාමාජිකත්වය ලැබූ අයද ;

අදහස් වේ..

ඩී. එම්. රංහාමි,
තිරගන්දහය (බටහිර) ගම් සභාපති තැන.

1973 පෙබරවාරි මස 05 වෙනි දින,
බෝයගනේ, ගම්සභා කාර්යාලයේදීය.

3–725—73.03.02 දින අංක 49 දරණ ගැසට් පත්‍රය

---

### පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් (261 වැනි අධිකාරය) පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය ප්‍රකාර 1972 මාර්තු මස 10 වැනි දින අංක 15,001 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද සංශෝධිතයට දක්වන XVIII වැනි කාණ්ඩය පිළිගැනීමටත්. එය ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවන දින සිට මාතර දිස්ත්‍රික්කයේ මිරිස්ස ගම් ප්‍රදේශයේ ක්‍රියාත්මක කිරීමටත්, 1973 ජනවාරි මස 31 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේ දී සභා සම්මතයෙන් නිරණය කළ බැව් ප්‍රකාශ කරමි.

ඇම්. ආරනිස්,
මිරිස්ස ගම්සභාවේ සභාපති.

1973. 02. වැනි දින,
මිරිස්ස ගම්සභා කාර්යාලයේදීය.

### අතුරු ව්‍යවස්ථා

කලින් කළ සංශෝධනය කරන ලද පරිදි වූ 1953 අප්‍රේල් මස 10 වැනි දින අංක 10,517 දරණ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථාවල XVIII වැනි කොටසෙහි අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාරවලට අදාල අතුරු ව්‍යවස්ථා පහත සඳහන් පරිදි වැඩිදුරටත් සංශෝධනය කරනු ලැබේ.

(1) එහි 1 වැනි අතුරු ව්‍යවස්ථාව වෙනුවට පහත සඳහන් අලුත් ව්‍යවස්ථාව ආදේශ කිරීමෙන් :—

1. මෙම අතුරු ව්‍යවස්ථාවල "අන්තරාදායක හෝ අප්‍රසන්න ව්‍යාපාර" යන්නෙන් මෙහි වූ උපලේඛනයෙහි අවස්ථාවෝචිත පරිදි I වැනි කොටසේ, II වන කොටසේ හෝ III වැනි කොටසේ නිශ්චිතව සඳහන් යම් ව්‍යාපාරයක් අදහස් වේ. තවද,

(2) එම කොටසෙහි අවසානයට පහත දක්වෙන උපලේඛනය අන්තර්ගත කිරීමෙන් :—

### උපලේඛනය

I වැනි කොටස—අන්තරාදායක ව්‍යාපාර

කබුක්, බොරළු හෝ කලුගල් කැනීම
කබුක්, බොරළු හෝ කලුගල් ගබඩා කිරීම
සිසිල් බීම නිෂ්පාදනය

ග්‍රෝස් 1 ට වැඩි ප්‍රමාණයක සිසිසිල් බීම ගබඩා කර තබා ගැනීම
අයිස් නිපදවීම
කොප්පරා නිෂ්පාදනය කිරීම, ඇකස් කිරීම හෝ ගබඩාකර තබා ගැනීම
යන්ත්‍රානුසාරයෙන් හෝ වෙනත් ක්‍රමයකින් එළවළු තෙල් නිෂ්කරණය
ගැළුම් 50 ට වැඩි ප්‍රමාණයක පොල් තෙල් ගබඩා කර තබා ගැනීම
පොල් තෙල් හැර වෙනත් එළවළු තෙල් වර්ගයක් ගැළුම් 12 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම

ග්‍රෝස් 10 ට වැඩි ප්‍රමාණයක ගිනිපෙට්ටි ගබඩා කර තබා ගැනීම
ඉඹුල් පුළුන් හෝ කපු පුළුන් ගබඩා කර තබා ගැනීම
කොහු හෝ වෙනත් කෙඳි වර්ග වලින් සාදන ලද භාණ්ඩ ගැනීම
කොහු හෝ වෙනත් කෙඳි වර්ග වලින් සාදන ලද භාණ්ඩ නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම
ගඩොල් හෝ උළු ගබඩා කර තබ ගැනීම
පිදුරු ගබඩා කර තබා ගැනීම
පාවිච්චි කළ ඇඳුම් ගබඩා කර තබා ගැනීම
කුලියට දීමට ලාම්පු ගබඩා කර තබා ගැනීම
ධාන්‍ය හෝ මාෂ බෝග වර්ග හොන්ඩර 5 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම
ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අළුත්වැඩියා කිරීම
තේ පෙට්ටි හෝ ලෑලි පෙට්ටි නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම
යන්ත්‍රෝපකරණ පාවිච්චි නොකෙරෙන කම්හලක් පවත්වාගෙන යාම
අතින් ලී ඉරුම් වලක් හෝ ඉරුම් මෝලක් පවත්වාගෙන යාම
දැව ගබඩාවක් පවත්වාගෙන යාම
ගිරිගල් හෝ හුණුගල් සඳහා හෑරීම
දර ගබඩාවක් පවත්වාගෙන යාම
යන්ත්‍රෝපකරණ පාවිච්චි කෙරෙන කම්හලක් පවත්වාගෙන යාම
යන්ත්‍රෝපකරණ පාවිච්චි නොකෙරෙණ කම්හලක් පවත්වාගෙන යාම
තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුනු, හෝ සීනි හොණ්ඩර 15ට වැඩි කිසිගම් ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම
හිස් බෝතල් හෝ හිස් ගෝනි ගබඩා කර තබා ගැනීම
බයිසිකල් හෝ මෝටර් බයිසිකල් අලුත්වැඩියා කිරීම සඳහා වැඩ පලක් පවත්වාගෙන යාම
අලුත් හෝ පාවිච්චි කරන ලද රබර් ටයර් හෝ ටියුබ් 50 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම
පොල් කටු ගබඩා කර තබා ගැනීම
ගෙන්දගම් හෝ ගෙන්දගම් කුඩු හොණ්ඩර 10 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම
පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්‍ර කඩදාසි හෝ ගබඩා කර තබාගැනීම
විසිරී පින්තාරු කිරීම (ස්ප්‍රේ පේන්ටිං) සඳහා ආයතනයක් තබා ගැනීම
අත් යන්ත්‍ර මාර්ගයෙන් හැර වෙනත් විධියකින් නූල් කැටීම හෝ වීවීම
සිල්ක් සහ කෘතිම රෙදි වීවීම හා විසිතුරු කිරීම
අත් යන්ත්‍ර ක්‍රමයෙන් හැර වෙනත් විධියකින් රෙදි නිපදවීම
මැසූ ඇඳුම් නිෂ්පාදනය
මුද්‍රණාලයක් පවත්වාගෙන යාම
මැතිලේටඩ් ස්ප්‍රීත්තු නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම

## II වැනි කොටස—අප්‍රසන්න ව්‍යාපාර

මිනිරන් සුද්ධ කිරීම හෝ ගබඩා කර තබා ගැනීම
පෝර හෝ රසායනික පෝර නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම
හම් පදම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
හම් ගබඩා කර තබා ගැනීම
උම්බලකඩ නිෂ්පාදනය කිරීම හෝ හොණ්ඩර 5ට වැඩි ප්‍රමාණයක් උම්බලකඩ ගබඩා කර තබා ගැනීම
කුකුලන් 100 කට වැඩි ගණනක් සඳහා කුකුල් ගාලක් හෝ කුකුල් කොටුවක් පවත්වාගෙන යාම
බැටළුවන්, එළුවන් හෝ ඌරන් දහයකට වැඩි ගණනක් සඳහා මඩුවක් හෝ ගාලක් පවත්වාගෙන යාම
රබර් නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම
පශු වෛද්‍ය ගිලන්හලක් පවත්වාගෙන යාම
පුවක් සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම
තොග වශයෙන් විකිණීම සඳහා නරක් වන සුළු කෑම වර්ග සහ ආහාර වගී ගබඩා කර තබා ගැනීම
කරවල, ලුනු මාළු හෝ ජාඩි හොණ්ඩර 3 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම
අඟුරු සඳහා දැව හෝ පොල් කටු දැවීම හෝ අඟුරු ගබඩා කර තබා ගැනීම
සිමෙන්ති හොණ්ඩර 25 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම
අලවන ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම
දුම්කල සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම
සත්වාහාර ගබඩාවක් පවත්වාගෙන යාම
පුනක්කු ටොන් 1 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම
සත්වාහාර හෝ කුකුල් කෑම නිෂ්පාදනය කිරීම
සතුන්ගේ මාංසාවශේෂ හෝ ලේ පැසවීම
සබන් නිෂ්පාදනය කිරීම
සව් හෝ මඤ්ඤොක්කා කැට් (ටැපියෝකා) නිපදවීම
ඇටකටු ගබඩා කිරීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම
ටිරන්ක් පෙට්ටි සෑදීම
අලුත් ලෝහ හෝ පරණ ලෝහ ගබඩා කර තබා ගැනීම
ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩා කර තබා ගැනීම
ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම
මෙරට හෝ රට වේවැල් වලින් භාණ්ඩ සෑදීම හෝ එයින් කළ භාණ්ඩ ගබඩා කර තබා ගැනීම
වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
කොන්ක්‍රීට් හෝ මැටි පයිප්ප ගබඩා කර තබා ගැනීම
සිරප් හෝ පළතුරු බීම වර්ග සෑදීම
රස කැවිලි වර්ග නිපදවීම
පොල් ලෙලි හෝ දැව පල් කිරීම සඳහා කොටුවක් පවත්වාගෙන යාම
මේද නිපදවීම හෝ නිෂ්කරණය කිරීම
දත් බුරුසු හැර වෙනත් බුරුසු වර්ග නිපදවීම
දත් බුරුසු නිපදවීම
රා එකතු කරන ස්ථානයක් පවත්වාගෙන යාම
විනාකිරි නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම
ඇසිඩ් වර්ග නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම
හුණුගල් හෝ හුණු ගබඩා කර තබා ගැනීම
පැනි නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම
පින්තාරු තීන්ත, වාර්නිස් හෝ ඩිස්ටැම්පර් සායම් හෝ ඒවා හොණ්ඩර 5ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම
ලෑලි සකස් කිරීම හෝ ලී පදම් කිරීම
සෝඩා නිපදවීම
රෙදි සායම් කිරීම
කොකෝවා හෝ වියලි පැපොල් කිරි ගබඩා කර තබා ගැනීම
සම් භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
පළතුරු මාළු හෝ වෙනත් කෑම වර්ග ටින්වල ඇසිරීම
කෝපි ධාන්‍ය වර්ග, මාෂ භෝග, කුළු බඩු හෝ පිටි ඇඹරීම
යන්ත්‍රානුසාරයෙන් ධාන්‍ය හෝ මාෂ බෝග කෙටීම
බේකිං පවුඩර් නිපදවීම
මාජරින් නිපදවීම
ගෑස් මැන්ටල් නිපදවීම
පොට් නිපදවීම
ඉටිපන්දම් නිපදවීම
කපුරු නිපදවීම
ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම
සායම් කුඩු නිපදවීම
ලාකඩ නිපදවීම
සුවඳ පුයර නිපදවීම
පාසල් රටහුණු නිපදවීම
ටයර් කට්ටා කැපීම හෝ පිරවීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම
ටයර් හෝ ටියුබ් වෝල්කනයිස් කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම
සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බෙස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම
වැලි කඩදාසි නිපදවීම
ගල් නිපදවීම, ඇඹරීම හෝ ඔප දැමීම
පාසැල් ගල්ලෑලි නිපදවීම
සෞඛ්‍ය තුවාකඩ නිපදවීම
ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම
සෙල්ලම් බඩු නිපදවීම
මුහුදු පාසි සකස් කිරීම හා ගබඩා කර තබා ගැනීම
සීත කළ මස් හෝ මාළු ගබඩා කර තබා ගැනීම
කපාපු පොල් නිපදවීම
ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම
මැණික් ගල් කැපීම හා ඔප දැමීම
දිය හුණු, සුදු (වයිටිං) හුණු හෝ හිරි ගල් නිපදවීම
එන්සාල් (කරදමුංගු) සකස් කිරීම හෝ වේලීම

## III වැනි කොටස—අන්තරායක සහ අප්‍රසන්න ව්‍යාපාර

තලාතු මිනිරන් ශුද්ධ කිරීම
රසායන ද්‍රව්‍ය පාවිච්චිකොට කුරුඳු (කරදමුංගු) එන්සාල් හෝ කෙඳි වර්ග සකස් කිරීම
ඩ්‍රයි ක්ලීනින් කරන ස්ථානයක් හෝ සායම් දමන ස්ථානයක් පවත්වාගෙන යාම
රෙදි මුද්‍රණය කරන හෝ සායම් දමන ස්ථානයක් පවත්වාගෙන යාම

විද්‍යුත් ලෝහාලේපනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම
තෙල් හෝ සත්ව මේද සැපයීම
හුණු පිලිස්සීම, සකස් කිරීම, ගබඩා කිරීම හෝ හුණුගල් කැඩීම
මැටි බඳුන් ඔප දැමීම

ගිනි කෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා විකිනීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම
මෝර වරල් සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම
හොන්ඩර 5 ට වැඩියෙන් තේ ගබඩා කර තබා ගැනීම
බැටරි චාජ් කිරීම හෝ අළුත්වැඩියා කිරීම

වැල්ඩින් සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම
මෝටර් වාහන සර්විස් කිරීම හෝ අළුත්වැඩියා කිරීමේ වැඩ පලක් පවත්වාගෙන යාම

බෝට්ටු තැනීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම
යන්ත්‍රානුසාරයෙන් ලෝහ භාණ්ඩ කුඩු කිරීම
චාත්තු මඩුවක් පවත්වාගෙන යාම

බෙලෙක් වැඩ පලක් පවත්වාගෙන යාම
ගල් ස්මාරක නිපදවීම
පැට්රෝල්, ඩීසල් තෙල් හෝ වෙනත් යම් ඛනිජ තෙල් වර්ගයක් ගබඩාකොට ඇති ස්ථානයක් පවත්වාගෙන යාම

පැට්රෝල් නිකුත් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
මෝටර් වාහන සඳහා බොඩි නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

පොලිස් ඉටි වර්ග නිපදවීම
කෘෂි රසායන ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම
විෂ බීජ නාශක ද්‍රව්‍ය නිපදවීම

මදුරු කොයිල් (කොයිල්ස්) නිපදවීම
ලී දඬු ආරක්ෂක ද්‍රව්‍ය නිපදවීම
රබර් ද්‍රාවක හෝ රබර් සිමෙන්ති නිපදවීම

ගල්තාර හෝ වෙනත් බිටුමන්මය නිෂ්පාදන නිපදවීම
වීදුරු භාණ්ඩ නිපදවීම
වීදුරු කැඩපත් නිපදවීම

යකඩ තහඩු ගැල්වනයිස් කිරීම
පාස්සන ඊයම් නිපදවීම
ඇලුමිනියම් භාණ්ඩ නිපදවීම
කටු කම්බි නිපදවීම
කම්බි ඇණ නිපදවීම
කාබන් කඩදාසි හෝ යතුරු ලියන පටි (රිබන්) නිපදවීම
බෙලෙක් බඳුන්, වාතන් පීප්ප, හෝ ගබඩා ටැංකි නිපදවීම
ජී. අයි. බාල්දි නිපදවීම
වායු සමන යන්ත්‍ර, ශීතකරන හෝ අධි ශීතකරන (ඩීප් ෆ්‍රීසර්) නිපදවීම, සර්විස් කිරීම හෝ අලුත්වැඩියා කිරීම
බ්‍රේක් ලයිනින් හෝ ක්ලච් ලයිනින් නිපදවීම
යන්ත්‍රෝපකරණ නිපදවීම
ඊයම් බැටරි නැවත චාජ් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම
රබර් කැවුනු කෙඳි වර්ග නිපදවීම
සංචායක බැටරි නිපදවීම
වියලි කෝෂ බැටරි නිපදවීම
යන්ත්‍රම් සුන්බුන් වලින් වටිනා ලෝහ නිෂ්කරණය සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම
වරක්ටර් රථ එකලස් කිරීම
රේඩියේටර් නිපදවීම
විදුලි කර්මාන්ත වැඩපොලක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර අළුත්වැඩියා කරන ස්ථානයක්, ගුවන් විදුලි නිපදවන වැඩ පොලක් පවත්වාගෙන යාම

3-7—73.03.02 දින අංක 49 දරණ ගැසට් පත්‍රය

---

## යටිනුවර ගඟ පළාත ගම්සභාව

### ගෝඝාතක ආඥාපනත

මෙහි පහත සඳහන් උපලේඛනයේ සඳහන් වන අය එකී උපලේඛනයෙහි දක්වෙන ස්ථානයෙහි 1973 වර්ෂයට ගවමස් විකිණීම සඳහා අවසර පත්‍රයක් ඉල්ලා අයදුම්පතක් මාවෙත එවා තිබෙන බව, ගෝඝාතක ආඥාපනතේ (257 වැනි අධිකාරය) 7 වැනි වගන්තිය යටතේ මෙයින් දනුම් දෙමි.

එම අවසර පත්‍රය නිකුත් කිරීම ගැන මහනුවර දිස්ත්‍රික්කයේ යටිනුවර ගඟ පළාත ගම්සභා බල ප්‍රදේශයේ තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් කුමන කරුණු නිසාද යන වග ලියවිල්ලක් මඟින් පිටපත් දෙකක් සහිතව මෙම දන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුළත මාවෙත එවිය යුතු බව මෙයින් දන්වා සිටිමි.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | වෙළඳාමේ ස්වභාවය | පිහිටීම |
|---|---|---|
| තම්බිලෙබ්බෙ මහරූප් මහතා ... ... ... | ගව මස් වෙළඳාම ... | යහලතැන්න–අටුවගාව වත්ත, මුරුතලාව |

ගුණරත්න මානෙල්ලංග,
සභාපති,
යටිනුවර ගඟ පළාත ගම්සභාව.

මුරුතලාව, 73.01.31.

3-696—73.03.02 දින අංක 49 දරණ ගැසට් පත්‍රය

---

## දන්කොටුව සුළු නගර සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත සඳහන් වන උපලේඛනයෙහි නම් සඳහන් අය විසින් 1973 වර්ෂයට එහි සඳහන් ස්ථානයන්හි මස් කඩ පවත්වාගෙන යාමට බලපත්‍ර ඉල්ලුම් කර ඇති බවත්, ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීම ගැන දන්කොටුව සුළු නගර සභා සීමාව ඇතුළත පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු පෙන්වා පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මෙම දන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුළත දී මා වෙත ලියා එවීමට බලය ඇති බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (සංශෝධිත ව්‍යවස්ථා ප්‍රඥප්තියේ 272 වෙනි අධිකාරය) 7 (2) වැනි වගන්තියේ ප්‍රකාර මෙයින් දනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

| | ඉල්ලුම්කරුගේ නම | වෙළඳාම | ස්ථානය |
|---|---|---|---|
| 1. | කේ. ජුස්තිනා පෙරේරා මහත්මිය ... ... ... | ඌරු මස් ... | පොදු වෙළඳ සැල, අංක 6 දරණ කඩය |
| 2. | කේ. ජුස්තිනා පෙරේරා මහත්මිය ... ... ... | හරක් මස් ... | පොදු වෙළ සැල, අංක 8 දරණ කඩය |
| 3. | ඩබ්ලිව්. සෙබස්ටියන් ප්‍රනාන්දු මහතා ... ... | එළුමස්, හරක්මස්, ඌරු මස් ... | ගෝනාවිල මස් කඩය |

ඇම්. පී. දිසානායක,
සභාපති,
දන්කොටුව සුළු නගර සභාව.

1973 ක්වූ ජනවාරි මස 19 වැනි දින,
දන්කොටුව සුළු නගර සභා කාර්යාලයේ දී ය.

3-515—73.03.02 දින අංක 49 දරණ ගැසට් පත්‍රය

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ

# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන සංශෝධිත ගාස්තු

1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට ක්‍රියාත්මක වේ

(සෑම සිකුරාද දිනයන්හි පළ කරනු ලැබේ)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිට ය.

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපැලෙන් එවීමට හෝ යොමුවීත් භාර දීමට හෝ පුළුවන.

3. සෙනසුරාද පෙරවරු 8 සිට දහවල් 12 දක්වාද, වෙනත් දිනවල පෙරවරු 8 සිට පස්වරු 3.30 දක්වා ද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැළකිය යුතුයි.

4. සෙනසුරාද පෙරවරු 11 ට සහ වෙනත් දිනවල පස්වරු 2.30 ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ට්ල් ඕඩරයක් හෝ චෙක්පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෝෂ වලක්වා ගැනීම සඳහා, පළකරන්නාට නියමිත "පිටපත" කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි. ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, අදාළ උසාවියේ රෙජිස්ට්‍රාර් මහතාගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරන ගාස්තු මෙසේ වේ :—

| | | |
|---|---|---|
| | රු. | ශ. |
| අඟලකට හෝ ඊට අඩුව ... ... ... | 20 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... | 20 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 220 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 440 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. සෑම සිකුරාද දිනයකම ශ්‍රී ලංකා ජනරජයේ "ගැසට්" පත්‍රය පළකරනු ලැබේ. ප්‍රසිද්ධ කිරීමට නියමිත දින අතරම පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. 1966 මාර්තු 1 වෙනිදා සිට ගැසට් පත්‍රයේ සෑම කොටසකම කොළඹවරෙන් වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ, මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.

13. 1968.12.1 දින සිට සංශෝධිත දායක ගාස්තු*—

ආණ්ඩුවේ ගැසට් පත්‍රය—වාර්ෂික

| | මෙරට | | පිටරට | |
|---|---|---|---|---|
| | රු. | ශ. | රු. | ශ. |
| මුළු කොටසම ... | 46 | 0 | 60 | 0 |
| I වැනි කොටසේ එක ඡේදයක් ... | 36 | 0 | 42 | 0 |
| I වැනි කොටසේ ඡේද දෙකක් ... | 43 | 50 | 51 | 50 |

වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ කිසි වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නොඅඩු කාලයකට පමණය.

*තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීම සිටුම් කළේ)

| | මිල | | තැපැල් ගාස්තු මෙරට | |
|---|---|---|---|---|
| | රු. | ශ. | රු. | ශ. |
| (අ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළතදී, එක කොටසක් ... | 0 | 50 | 0 | 20 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, එක කොටසක් ... | 1 | 0 | 0 | 20 |
| (ආ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළත දී I වැනි කොටසේ එක ඡේදයක් ... | 0 | 30 | 0 | 15 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු I වැනි කොටසේ එක ඡේදයක් | 0 | 60 | 0 | 15 |

දායක මුදල් බාර ගැනීම සහ තනි පිටපත් විකිණීම බාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහාලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සෑ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරි වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

**1973**

| මාසය | පළකිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව |
|---|---|---|
| පෙබරවාරි ... | 73.02.02 සිකුරාද ... | 73.01.26 සිකුරාද දවල් 12.00 |
| | 73.02.09 සිකුරාද ... | 73.02.02 සිකුරාද දවල් 12.00 |
| | 73.02.15 බ්‍රහස්පතින්ද ... | 73.02.09 සිකුරාද දවල් 12.00 |
| | 73.02.23 සිකුරාද ... | 73.02.15 බ්‍රහස්පතින්ද දවල් 12.00 |
| මාර්තු | 73.03.02 සිකුරාද ... | 73.02.23 සිකුරාද දවල් 12.00 |
| | 73.03.09 සිකුරාද ... | 73.03.02 සිකුරාද දවල් 12.00 |
| | 73.03.16 සිකුරාද ... | 73.03.09 සිකුරාද දවල් 12.00 |
| | 73.03.23 සිකුරාද ... | 73.03.16 සිකුරාද දවල් 12.00 |
| | 73.03.30 සිකුරාද ... | 73.03.23 සිකුරාද දවල් 12.00 |
| අප්‍රේල් ... | 73.04.06 සිකුරාද ... | 73.03.30 සිකුරාද දවල් 12.00 |
| | 73.04.11 බදාද ... | 73.04.06 සිකුරාද දවල් 12.00 |
| | 73.04.19 බ්‍රහස්පතින්ද ... | 73.04.11 බදාද දවල් 12.00 |
| | 73.04.27 සිකුරාද ... | 73.04.19 බ්‍රහස්පතින්ද දවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 ඔක්තෝබර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.